# 09 ශ්‍රේණිය – සිංහල

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු 01 වාරය 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(විවිධ පළාත්, කලාප සහ පාසල් මගින් පළමුවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 09ක් සහ ලැබී ඇති පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | 1/11 | පැය / மணித்தியாலம் / Hours | 02 |

**සැලකිය යුතුයි**

- **පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. 1,11 පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.**

---

- අංක 1 හා 2 වාක්‍ය වල ඉරි ඇඳි කොටසෙහි අදහස ප්‍රකාශ වන පිළිතුර තෝරන්න

1) ක්‍රිකට් තරගාවලියේදී ශ්‍රී ලංකාව හා බංගලාදේශය කරට කර තරග වැදුණේය.
   1. ජයග්‍රාහී ව
   2. ප්‍රතිවිරුද්ධ ව
   3. සමගි ව
   4. සමාන දක්ෂකම් ඇති ව

2) නාට්‍ය ආරම්භ වන තෙක් ප්‍රේක්ෂකයෝ පුල පුලා බලා සිටියෝ ය.
   1. දෙගිඩියාවෙන්
   2. නො ඉවසිල්ලෙන්
   3. කල්පනාකාරි ව
   4. පුදුමයෙන්

3) පහත සඳහන් යෙදුම් අතුරින් ආප්තෝපදේශ ගනයට අයත් පිළිතුරු වන්නේ,
   1. ඇවිද්ද පය දහස් වටී
   2. කිරිගහට ඇන්නා වගේ
   3. අවවාදයට වඩා ආදර්ශය උතුම්ය
   4. ඉහේ මලක් පිපුණා වගේ

   1) 1 හා 2 ය 2) 2 හා 4 ය 3) 1 හා 3 ය 4) 1 හා 4 ය

4) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරන්න.
   1. ශිෂ්‍යාචාරය , කොට්ඨාසය
   2. පරිවර්ථනය,මර්දනය
   3. උච්ඡාරණය,සමස්ථය
   4. විශිෂ්ට,පර්යේෂණය

5) තාලුජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   1.ක,ඛ,ඛ,ඝ,ණ 2. ප,ඵ,බ,භ,ම 3.ච,ඡ,ජඣ,ඤ 4. ට,ඨ,ඩ,ඪ,ණ

6) " ත" වර්ගයේ අක්ෂර දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   1) ආරක්ෂාව 2) සංවිධානය 3) තරගය 4) විලාසය

7) මුලින් දී ඇති පදයෙහි සමානාර්ථ පද ඇතුළත් පිළිතුර තෝරන්න.
   1) දිය - ලෝකය,ජය,ජලය,රද
   2) ශක්‍රයා - සහසැස්,සක්,පුරදුරු, සුරරජ
   3) තඹර - නෙළුම්, පද්ම, අරවින්ද,කුමුදු
   4) හය - අශ්ව,තුරඟ,ගජ,අජ

8) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය **නොදෙන** පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) අලස - කාර්යශූර ,උත්සාහවන්ත
2) ඌන - අතිරික්ත ,වැඩි
3) සුදන - දුර්ජන , සජ්ජන
4) සුලභ - විරල ,දුර්ලභ

9) එකිනෙකට සමානාර්ථ හා සමීපාර්ථ ප්‍රකාශවන යුගල පද ඇතුළත් පිළිතුර වන්නේ,

1) නැටුම් ගැයුම්, ලියුම් කියුම්,දුව පැන
2) ශූර වීර, ඉවුම් පිහුම්, ශුද්ධ පවිත්‍ර
3) කොට්ට මෙට්ට, වට්ටි පෙට්ටි, වත් පිළිවෙත්
4) එහා මෙහා, උඩ යට, අතන මෙතන

1) 1 හා 2 ය 2) 1 හා 3 ය 3) 2 හා 4 ය 4) 2 හා 3 ය

10) “ඔබට දීර්ඝායුෂ ලැබේවා !”යි පියා පැතුවේ ය.

ඉහත වාක්‍යයට සුදුසු විරාම ලක්ෂණ වන්නේ,

1) තනි උඩුකොමා,විස්මයාදි ලකුණ,තිත
2) යුගල උඩුකොමා,දෙතිත, කෙටි ඉර
3) යුගල උඩු කොමා,විස්මයාදි ලකුණ, තිත
4) තිත් කොමාව,ප්‍රශ්නාර්ථය,දෙතිත

11) මල් ගොමු <u>ගුමු ගුමු</u> ගන්වන්නි
ඉහත කාව්‍ය පාදයේ ඉරි ඇඳි කොටසෙහි කාව්‍යාලංකාරය වන්නේ,

1) උපමාලංකාරය යි 2) රූපකාලංකාරය 3) එළිසමය යි. 4) අනුප්‍රාසය යි

12) ‘බොහෝ දැනුම ඇත්තෝ’ යන්නට සුදුසු පදය වන්නේ ,

1) නායකයෝ ය 2) චින්තකයෝ ය 3) බහුශ්‍රැතයෝ ය 4) විද්‍යාඥයෝ ය

- අංක 13 සිට 15 තෙක් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පද තෝරන්න.

13) සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ........................... රසවත් කාව්‍යාලංකාර හඳුනාගත හැකි ය.

1) පරීක්ෂාවෙන් 2) පරිශීලනයෙන් 3) පරිග්‍රහණයෙන් 4) පරිභෝජනයෙන්

14) මහගමසේකර මහතා අපූර්ව පද .............................. දේශාභිමානී ගීත රචනා කර ඇත.

1) සංයෝජනයෙන් 2) සංග්‍රහයෙන් 3) සංස්කරණයෙන් 4) සම්භාවිතයෙන්

15) මෙරට සිටි බොහෝ රජවරු වෙහෙර,විහාර ....................................... කර බෞද්ධාගමේ දියුණුවට කටයුතු කළෝය.

1) ප්‍රවර්ධනය 2) ප්‍රතිසංස්කරණය 3) ප්‍රරෝහණය 4) සංශෝධනය

16) මුලින් දී ඇති පදයේ අර්ථය වැරදි ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.

1) අනපේක්ෂිත - බලාපොරොත්තු නොවූ
2) චිරන්තන - පැරණි
3) උදුල - බබළන
4) ශ්ලෝක - පාලි ගාථා

17) අනුක්ත බහුවචන නාම පදය තෝරන්න.

1) ගායිකාවෝ 2) විද්වතෙකු 3) රසිකයින් 4) කාන්තාවක්

18) " මග දිගට ජන කතා" " කළු කුහර" යන ග්‍රන්ථ ලියූ ලේඛකයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) ඩී.පී.වික්‍රමසිංහ මහතා, ස්ටීවන් හෝකින් මහතා
2) ස්ටීවන් හෝකින් මහතා , ජෝර්ජ් එලිස් මහතා
3) පණ්ඩිභාරත මහතා, හරින්දාස් නාරායන් මහතා
4) ඩබ්.ඩී.මකුලොලුව මහතා, චිත්‍රසේන ඩයස් මහතා

- 19-20 ප්‍රශ්න වල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

19) 1) පුංචි තාරකාවෝ රාත්‍රී අහසේ බබළයි.
2) ඔවුන් චාරිකාවක් ගියෝ ය.
3) ගායිකාව මිහිරි ගීයක් ගැයුවා ය.
4) මා ද ඔවුන් සමඟ යමි.

20) 1) තුරු පෙළ සුළඟට සෙලවෙති.
2) සභා තොමෝ සතුටින් විසිර ගියහ.
3) සමහරෙකු පරාර්ථය උදෙසා වැඩ කරති.
4) තුරු මුදුන්වල සියොත් කැල නද දෙති.

( ලකුණු 2x 20=40 )

## 11 කොටස

**1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01) පන්ති කාමරයේදී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i) බිත්ති පුවත්පත සඳහා ඔබේ කණ්ඩායම ඉදිරිපත් කළ නිර්මාණය කුමක් ද? (ලකුණු 02 යි)
ii) එම නිර්මාණය සකස් කිරීමේදී ගුරුතුමාගෙන් /ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
iii) ඔබේ නිර්මාණය සඳහා තොරතුරු සපයා ගත් ක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
iv) නිර්මාණය සකස් කිරීමේදී ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
v) ඔබේ කණ්ඩායම් නායකයා තුළ දක්නට ලැබුණු ගුණාංග **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)
vi) බිත්ති පුවත්පත සකස් කිරීමෙන් ඔබට ලැබුණු කුසලතා **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

( මුළු ලකුණු 16 යි)

02) පහත සඳහන් කොටස් වලින් **එකක්** තෝරා ගෙන වචන **200** කට නොඅඩු රචනයක් ලියන්න.

i) දැනුම පමණක් නොව මානව ගුණධර්ම වර්ධනයට මනුෂ්‍යාත්වයේ විචිත්‍රත්වය දකින්නට විවේකය ඵලදායිව යොදා ගැනීමට කියවීමේ රුචිය වර්ධනය කළ යුතු ය. මේ ගැන අවධානය යොමු කරමින් "කියවීමේ අගය" යටතේ රචනයක් ලියන්න.

ii) අභීත වීර රජ දරුවන්, මුතුන් මිත්තන් කළ දස්කම් විස්කම් නිසාත් සුවිශේෂී පිහිටීම, ඉසුරුමත් බව, ස්වභාව සෞන්දර්යය නිසාත් ශ්‍රී ලංකාව ලොව දස දෙස ප්‍රසිද්ධ වී ඇත." " මගේ මාතෘ භූමිය" යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.

iii) රියදුරන්ගේ නොසැලකිල්ල හා ජනතාව මාර්ග නීති නොසලකා ක්‍රියා කිරීම නිසා දිනෙන් දින මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් නැතිවී යයි. එය රටේ අභාග්‍යයකි.මේ ගැන සලකා "මාර්ග නීති පිළිපදිමු" යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.

iv) රූපවාහිනිය හා පරිගණකය අධ්‍යාපනය සඳහා භාවිත කළ හැකි වටිනා මාධ්‍යයන් දෙකකි.එහෙත් වර්තමානයේ ළමා පරපුර නාට්‍ය,කාටූන් වැනි වැඩසටහන් වලට නැඹුරු වී ඇති නිසා රූපවාහිනියෙන් හා පරිගණකයෙන් නිසි ප්‍රයෝජන නොගනිති.මේ කරුණු සලකා "අධ්‍යාපනය සඳහා රූපවාහිනිය හා පරිගණකය උදවු කර ගනිමු"යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.

v) පාසල් ඇරී ගෙදර පැමිණි සුරංග වත්ත පහළට ගියේ එහි සිටින කුරුල්ලන් බැලීමට ය. මොහොතකින් උණ පඳුර දෙසින් සතෙකු කෑ ගසන හඬ ඇසුණි. ............ එතැන් සිට කතාව ගොඩ නගන්න.

(ලකුණු 14 යි)

03) පාසල් පරිසර හට සංගමයේ ලේකම් ඔබ යයි සිතා පාසල අවට ඇති කැලි කසළ ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට යැවීමට සුදුසු ලිපිය ලියන්න.

(ලකුණු 10 යි)

04) පහත සඳහන් වාක්‍ය වල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරන්න.

i) පාසලේ ත්‍යාග .................. සඳහා සම්භාවනීය අමුත්තෝ සහභාගි වූහ.
(ප්‍රධානෝත්සවය / ප්‍රදානෝත්සවය)

ii) වටිනා ඖෂධ ..................... ආරක්ෂා කිරීමට දේශීය වෛද්‍යවරු පියවර ගනිති.
(පැළෑටි / පැලෑටි)

iii) ....................... සීතල සුළඟ පරිසරයට නැවුම් බවක් ගෙන එයි.
( අළුයම/අලුයම )

iv) සන්දේශ කාව්‍ය වල රසවත් දිය කෙළි ..................... දක්නට ලැබේ.
(වැණුම් /වැනුම්)

v) ලෝවාමහාපායේ ඇති ගල් ................අතීත සිංහලයාගේ දස්කම් විදහා පායි.(කුලුනු /කුලුණු)

(ලකුණු 2x5=10 යි)

05) පහත දැක්වෙන පද්‍යය හා ගීත ඛණ්ඩයේ ඉතිරි කොටස් සම්පූර්ණ කර අසා ඇති ප්‍රශ්න වලට ද පිළිතුරු සපයන්න.

(අ) I. දුක් විඳ දස මස උසුලා වැදූ දැයි අපෙ අම්මා
අඳුන් තෙලින් නිති සරසා ඇති කළ දැයි අම්මා
..............................................................
.............................................................. (ලකුණු 04 යි)

ii. මෙම පද්‍යය ඇතුළත් කාව්‍ය නිර්මාණය නම් කරන්න. (ලකුණු 01 යි)

(ආ) හෙළ මල් රඟ දී පිපී නටනවා
තිසා වැවේ ඉවුරේ
රතඹල රදළිය රජළිය වෙනවා
සීගිරි ගිරි මැඳුරේ
..........................................
............................................ (ලකුණු 04 යි)

iii. මෙම ගීතයේ රචකයා නම් කරන්න. (ලකුණු 01 යි)

06) පහත සඳහන් වාක්‍ය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

(1) ළමයි දිය ඇල්ල බලලා සතුටු වුණා
(2) සාහිත්‍ය උත්සවයේ දී ලේඛකයන් සම්මාන ලබා ගත්තා
(3) ඔවුන් මල් පුදලා බුදුන් වැන්දා
(4) මම හොඳින් පාඩම් කරලා විභාගය සමත් වෙනවා
(5) අපි පුස්තකාලයට ගිහින් පොත් කියවනවා (ලකුණු 2x5 =10)

07) පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

බොල් පිනි බරින් පවනින් ගිලිහෙන රොන් ය
නිල් තණ බිමින් නැගි පැහැයත් රන්වන්ය
මල් මී ලොබින් රොද බැඳ යන බිඟු කැන්ය
කුල්මත් ඔවුන් තුඩ්'නෙන ගුමු ගුමු සන්ය

පෙළා ගස් නමා අතු අග නමා සොඬ
සලා බුදින ගජසෙන් යති කඩින් කඩ
තලා කැකුණ වෙහෙසෙන වල් ඌරු ගොඩ
බලා හබන් කුකුළෝ නැඟු මඟුල් හඬ

නිලඹර නැගුණු අතු විහිදුණ මහ දූම්ය
මල්'වල ලියෙන් කළ විසිතුරු සැර සුම්ය
පලවැල මලා මැල්ලෙන් එන සැන සුම්ය
සලකමු මෙහැම වන සිරියගෙ සැලකුම්ය

1) මෙම පද්‍ය පන්තියෙන් වර්ණනා කරන්නේ කිනම් ස්ථානයක් ද?
2) ගජසෙන් කළේ කුමක් ද?
3) හබන් කුකුළන් කෑ ගැසුවේ ඇයි?
4) විසිතුරු සැරසිලි ලෙස තිබුණේ මොනවාද?
5) පහත සඳහන් පද වල අර්ථය ලියන්න
(අ) මහදූම් (ආ) රොද බැඳ යන ( ලකුණු 2x 5= 10 )

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S

සිංහල භාෂාව හා සාහිත්‍යය I - කොටස | කාලය පැය දෙකයි

නම ..............................................

සැලකිය යුතුයි :
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

★ අංක 01 සිට 02 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සම්මත සිංහල අක්ෂර මාලාවේ ව්‍යංජනාක්ෂර සංඛ්‍යාව

(1) 60 කි (2) 18 කි (3) 42 කි (4) 25 කි

(02) දන්තජ අක්ෂර ඇතුළත් නොවන වචනය තෝරන්න.

(1) ධනපති (2) තථාගත (3) අනිත්‍යය (4) පෝෂණය

★ නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(03) (1) ඖෂධ (2) වීරෝධාර (3) පාපිෂ්ඨ (4) විනිස්චය

(04) (1) ප්‍රශ්වාස (2) නිස්ශබ්ද (3) දර්ෂනය (4) පිළිවෙල

(05) පහත දී ඇති පද කුමන වියරණ වර්ගයකට අයත් දැයි තිත් ඉර මත ලියන්න.

(I) නටනටා .............................. (II) පිණිස ..............................

★ අංක 06 සහ 07 ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(06) ප්‍රවේශමෙන් (නාම විශේෂණයකි / ක්‍රියා විශේෂණයකි / මිශ්‍රක්‍රියා පදයකි / නිපාත පදයකි)

(07) ගොළුබෙලි ගමන (රූඪී පදයකි / ආප්තෝපදේශයකි / ප්‍රස්තාව පිරුළකි / යුගල පදයකි )

(08) පහත දී ඇති අනුක්ත පද වල උක්ත පදය ලියන්න.

(1) ගායිකාවක .............................. (II) ඔවුන් ..............................

(09) දී ඇති පද අතරින් යුගල පදයක් නොවන පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(I) යාම් ඊම් (II) අබල දුබල (III) බලමින් (IV) දුවන පනින

(10) පහත දැක්වෙන වාක්‍යය අතීත කාලයට හරවා නැවත ලියන්න.

මිනිස්සු ගවයන් කුඹුරට දක්කති.

(11) පහත දැක්වෙන වචන යොදා අර්ථවත් වාක්‍ය දෙකක් ලියන්න.

(1) අනපේක්ෂිත ..............................................................................................

(II) විචාරශීලී ..............................................................................................

(12) පහත සඳහන් වාක්‍යය නිදොස් කර නැවත ලියන්න.

(1) මාර්ටින් වික්‍රමසිංහ ශූරීහු නවකතා පොත් රැසක් ලියුවේය.

..............................................................................................

(II) ගුරුවරුන් අපට යහමඟ පෙන්වා දෙති.

..............................................................................................

(13) පහත සඳහන් පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.

(1) පතළ ........................................

(II) විකසිත ........................................

(14) පහත සඳහන් පදවලට ස්ත්‍රීලිංග පදය බැගින් ලියන්න.

(1) මාළුවා .......................................... (II) සොරා ..........................................

(15) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

(1) ලෝභ .......................................... (II) සුදන ..........................................

✶ **අංක 16 සිට 18 දක්වා වාක්‍යය වල හිස්තැන් සම්පූර්ණ කිරීමට වඩාත් සුදුසු වචනය වරහන් තුළින් තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

(16) ජන කතාව .................................. ට අයත් සාහිත්‍යාංගයකි. (සංස්කෘතිය / ජනශ්‍රැතිය)

(17) වෙනස් අර්ථයක් ධ්වනිත වන ලෙස යොදන භාෂාත්මක යෙදුම් ................................. නම් වේ (රූඩී / පිරුළු)

(18) දේශනයකට ................................. සවන් දීම දේශකයාට කරන ගෞරවයකි. (සාවධානව /විමර්ශනශීලීව)

✶ **පහත සඳහන් වාක්‍යය සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.**

(19) සිංහල අක්ෂර මාලාවේ ක අකුරේ සිට ම අකුර දක්වා ඇති අක්ෂර වර්ගාක්ෂර ලෙස හැඳින්වෙයි

(20) 2016 2017 විශ්ව විද්‍යාල අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් භාරගැනීම 20 වැනි දායින් අවසන් වේ

## II කොටස

✶ **පළමුවන , දෙවන , තෙවන හා සිව්වැනි ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු ලියන්න.**

(01) පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

(i) කිසියම් ජන කොට්ඨාශයක් අතර කාලාන්තරයක් තිස්සේ කටින් කට පැවත එන කතාන්දර, කවි, පිරුළු, රූඩී ආදිය හඳුන්වන නම ලියන්න.

(ii) 'මග දිගට ජන කතා' කෘතිය රචනා කළ රචකයාගේ නම කුමක් ද?

(iii) ආචාර්ය එස්. පණීභාරත මැතිතුමා මුලින්ම නැටුම් ශිල්පය ඉගෙනගත් ගුරුවරුන් දෙදෙනාගේ නම් ලියන්න.

(iv) "අද අපි මේ පවත්වන්නේ ඒ උතුම් කාර්යයි". යන ප්‍රකාශය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

(v) එකිනෙකට සමාන අර්ථ ඇති පද දෙකක් එකතු වීමෙන් සැදෙන යුගල පද දෙකක් ලියන්න.

(vi) ස්ටීවන් හෝකින් මහතා සිය ආචාර්ය උපාධිය සඳහා තෝරාගත් විෂය ක්ෂේත්‍රය කුමක් ද ?

(vii) දිවේ අග කොටස උඩට නැමී තල්ලේ මුදුනේ ගැටීමෙන් උපදින ශබ්ද හඳුන්වන නම හා එම ස්ථානයෙන් උපදින අක්ෂර මොනවා ද?

(viii) "පියාසර කර ආමි - දේශයෙන් දේශයට ........."
ගීතය ගායනා කරන ශිල්පියාගේ නම ලියන්න.

✶ **පහත සඳහන් කවි වල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(ix) ගසක දොඩම් මදෙයි කියා කෑදූයි අපෙ අම්මා
අහස තරුත් මදෙයි සිතා විලි ලූදූයි අම්මා
..........................................................................
..........................................................................

(x) මිහිරියි හැමෝට ම
සිරි ලංකා කියන නම
.......................................................................
.......................................................................

(ලකුණු 1 x 10 = 10)

(02) පෙළ පොත ඇසුරෙන් පහත සඳහන් ප්‍රකාශ වලට අදාළව පිළිතුරු සපයන්න.

(I) "යම් පුතෙක් මගේ ඒ අදහස ඉෂ්ට කළහොත් ඔහුට මාගේ මුළු වස්තුවම පවරන්නෙමි"

(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ඉ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

(II) "දැන් ඔබට එතුමාගේ රුව, හඬ හා දස්කම් දක්වෙන වීඩියෝ පටයක් නැරඹීමට මා අවස්ථාව සලසනවා"

(අ) ඉහත ප්‍රකාශය කළේ කවුද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුලත් පාඩමේ නම ලියන්න.

(ඉ) මේ ප්‍රකාශයේ සඳහන් එතුමා යනු කවරෙක්ද?

(III) දුක් විඳ දසමස උසුලා වැදූ දූයි අපෙ අම්මා
අඳුන් තෙලින් නිති සරසා ඇති කළ දූයි අම්මා
රස පල වැල නෙලා දීදී රස්සා කළ අම්මා
සතර අපා වල නොඉපද නිවන් දකින් අම්මා

(අ) මෙම පද්‍ය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) ඉහත කවියේ තුන්වන පදයෙන් පැවසෙන අදහස කුමක් ද?

(ඉ) අම්මා වෙනුවෙන් මේ දරුවන් දෙදෙනා විසින් කළ ප්‍රාර්ථනාවන් ඇතුළත් කවි පදය තෝරා ලියන්න.

(IV) "මම මගේ වැඩිමහල් සහෝදරයන් දෙදෙනා මඟට බැස්සවීමට සතුටු නොවෙමි"

(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ඉ) මෙම ප්‍රකාශය සිදුකළේ කවරෙකු හට ද?

(V) "ජීවිතයේ අනපේක්ෂිත බිඳවැටීම් සමූහයක් හමුවේ අකම්පිතව ඊට මුහුණ දී ලොව දස දිගෙහි ජය දද නැංවූ විද්වතෙකු ලෙස කීර්තියක් අත්කර ගැනීමට සමත් වූ මේ අසහාය මිනිසා ......."

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) ඉහත ප්‍රකාශයේ සඳහන් මේ අසහාය මිනිසා කවුද?

(ඉ) පාඩමට අදාල ලිපිය සම්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ලකුණු 3 x 5= 15)

(03) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

1. පරිසරය රැකුණොත් අපද රැකේ.
2. නවීන තාක්ෂණයේ නිසි ඵල ලබමු.
3. ගුණ දහමින් පිරි සමාජයක් බිහි කරමු.
4. අපරාධ අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග. (ලකුණු 20)

(04) ඔබ පාසලේ සාහිත්‍ය සංගමය මඟින් සිසු නිර්මාණ ඇතුළත් 'පන්හිඳක මහිමය' නැමති සිසු නිර්මාණ සංග්‍රහය දොරට වැඩීමේ උත්සවය වර්ෂ 2019 අප්‍රේල් මස 05 වෙනි දින පෙ. ව. 9.00 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් විදුහලේ විදුහල්පති තුමා සහභාගි වන අතර ගුරු දෙගුරුන්ට ද මේ සඳහා සහභාගි වන ලෙස දන්වමින් යැවීමට අදහස් කරන ආරාධනා පත්‍රය සකස් කරන්න. ඔබ, සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.

(ලකුණු 10යි)

(05) නිවැරදි ප්‍රකාශය වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(විෂ , කිරෙන් සේදුවත් , අඹරන කහ , පිටිකර , බලුවලිගේ , බේත් , කකුලේ)

(i) පය බරවායට ............................ බෙහෙත් බැන්දා වගෙයි
(ii) ගල හොඳනම් ............................ මක්වේද?
(iii) අඟුරු ............................ සුදු නොවේ
(iv) උණ පුරුකේ දැම්මත් ............................ ඇද නැරේ
(v) උගුරට හොරා ............................ කැවා වාගේ (ලකුණු 1 x 5 =5)

(06) වරහන් තුළ දී ඇති සමානරූපී පද වලින් නිවැරදි පදය තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) බුදුරජාණන් වහන්සේට ඇත්තේ මහා ............................ ගුණයකි. (කුලුණු / කුළුනු)
(ii) පාසලේ ජල ............................ පද්ධතිය පිළිසකර කළ යුතුය. (නල / නළ)
(iii) අඳුරේ ගමන් කරන ............................ මිනිසාට මඟ නිවැරදිව නොපෙනේ. (කන / කණ)
(iv) දුවද්දී ඇද වැටුණු ළමයාගේ ............................ තුවාල විය. (දන / දණ)
(v) මුහුදේ ගිලුන තරුණයාගේ ............................ සිරුර සොයා ගැනීමට නොහැකි විය. (මල / මළ)

(ලකුණු 1 x 5 = 5)

# පෙරහුරු ප්‍රශ්න පත්‍රය - සිංහල භාෂාව හා සාහිත්‍යය

## පළමු වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය

**1 කොටස** **කාලය පැය 02**

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**1- 3 දක්වා ප්‍රශ්නවල ගැළපෙන යෙදුම තෝරා යටින් ඉරක් අඳින්න.**

1. හැදෙන ගහ ................................. දැනේ. (දෙපෙත්තෙන්/දෙපැත්තෙන්)
2. පය බරවායට ................................. බෙහෙත් බැන්දා වගේ. (වටකර/පිටිකර)
3. අඟුරු ............................ සේදුවත් සුදු නොවේ. (දියෙන්/කිරෙන්)

**4- 5 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

4.(1) කොට්ඨාසය (2) පුස්ථකාලය (3) කණිෂ්ඨ (4) පිළිවෙල
5.(1) ශිෂ්‍යාචාරය (2) නිශ්ඵල (3) ගෘහස්ථ (4) වැණුම්

**6 - 9 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

6. ඉදිරියෙන් දී ඇති පදයට සමානාර්ථ පද පමණක් ඇති පිළිතුර තෝරන්න.

(1) සඳ - සිසි ,සොමි ,හිමකර,දිනකර (2) සතුට - ආහ්ලාදය, සොම්නස,සාංකාව,සන්තුෂ්ටිය
(3) සයුර - සිඳු,ජලනිධි,රුවනාර,සාගරය (4) රන් - ස්වර්ණ,කනක,කාංචන,රජත.

7.සෑම විරුද්ධාර්ථ පදයක් ම නිවැරදිව යොදා ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) වර්ධනය - ප්‍රවර්ධනය, සසල- නිසල , කසළ - නිකසළ
(2) ආගමන - විගමන, ස්ථිර - තාවකාලික, ශීල - දුශ්ශීල
(3) දොස් - සදොස්, මෙලොව - පරලොව, උපත - විපත
(4) හුරු - නුහුරු ජන -දුර්ජන, සසල - චංචල

8.යුගල පදයක් <u>නොවන</u> පදයක් ද ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඉහනිකට,ලටපට,දෙස්දෙවොල්.අතමිට (2) හරකබාන,වතුපිටි,මිලමුදල්,යානවාහන
(3) උසුළුවිසුළු,පාරතොට,ලඳුකැලෑ,හදිහූනියම් (4) කලබල,වදෙන්පොරෙන්,ලට්ටලොට්ට,ගනුදෙනු

9.සිංහල අක්ෂර මාලාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) අක්ෂර මාලාවේ සියලුම අකුරු ප්‍රාණාක්ෂර වේ. (2) භාවිතයේ පවතින ස්වර ඇත්තේ 15 ක් පමණි.
(3) වර්තාක්ෂරවලට නම් දෙක බැගින් යෙදේ. (4) අක්ෂර මාලාවේ අල්ප ප්‍රාණ අක්ෂර 20 ක් ඇත.

**10- 11 ප්‍රශ්නවල අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.**

10.(1) හිරුණි, ඔමල්මි,කවීෂා,පූජනිකා , තේජානි (2) අර්සද් ,ඉඳුවර,උදිත,දිනිසුරු,හිවින්,
(3) රවිපබා,සංචනා,ගිනුරි,මනෝමි,නෙතුලි (4) මිහින්,කෞෂික,ඉමල්ක,අංජන,චනුල්

11.(1) කනක,රත්තරන්,සමුදුර,සාගරය (2) ගම්පෙරළිය, කලියුගය,යුගාන්තය,අක්කරපහ
(3) අම්බලන්ගොඩ,පුත්තලම,උයන්ගල්ල,දෙනියාය (4)අභයගිරිය,ජේතවනය,රුවන්වැලිසෑය,අම්බස්තලය

12 උක්තපද දෙකක් හා අනුක්ත පද දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මිනිස්සු,දරුවන්,කාන්තාවක,සත්තු, (2) මම,අපි,ඔවුහු, තා
(3) සේවකයෙකු, ලේඛකයෙක්,ධනවත්තු,භික්ෂූහු (4) නැවියන්,පුතුන්,ගොන්නු,ලියන්න.

13 බහුවචන ක්‍රියාපද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කඩති,ඇන්දෝය,යන්නීය,ගැයුවේය (2) දුන්හ,පවසති,නියැලෙති,පිදුවෙමු
(3) යවයි,නිදුක්වෙම්වා,පැවසුවාය,දිනන්නේය (4) කරවයි,සකසයි,පැතුවාය,ගියේය

14 නිවැරදිව විරාම ලකුණු යොදා ඇති පිළිතුර තෝරන්න.

(1) "හෙට එන විට "ගම්පෙරළිය" නවකතාව කියවාගෙන එන්න" යැයි ගුරුතුමිය පැවසුවා ය.
(2) පාසල් සංවර්ධන සමිතියේ රැස්වීම පෙ.ව.8.00/10.00 දක්වා පැවැත් වේ.
(3) "පුතේ,හොඳින් පාඩම් කරන්න".යැයි පියා පැවසුවේ ය.
(4) අවුරුදු තේ මේසය කැවුම්; කොකිස් ;අලුවා හා කිරිබත්වලින් සමන්විත විය.

15 මහාප්‍රාණ අක්ෂරයක් <u>නොයෙදුණු</u> වචනයක් සහිත පිළිතුර තෝරන්න.

(1) ග්‍රන්ථය,විශිෂ්ට,ශ්‍රේෂ්ඨ,සංස්ථාව (2) සංඛ්‍යා,අභිධර්මය,ආරූඪ,ප්‍රභාවත්
(3) ධාර්මික,පෘථුල,සංඝ,සජ් ඣායනා (4) භීතිය,ථූපාරාමය,ධූරාවලිය,ලේඛනය

16. සෑම පදයක ම සඤ්ඤක අකුරු යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) අඹ, හඳ, විලඳ, හඬ (2) කඳ, හසළ, වඳු, කරඳ
(3) කඳු, සඟ,අණ්ඩය,ඉජුඃ (4) ගඟ, හඳ, කඳ, අඬනවා

17 ක්‍රියා විශේෂණ පද දෙකක් හා නාම විශේෂණ පද දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) විශාල, හෙමිහිට, තාලයට, උනන්දුවෙන් (2) වේගයෙනන්, කීකරු, නිහතමානී, උස
(3) නිහතමානීව, හඬනගා, දුකෙන්, කෝපයෙන් (4) සතුටින්, සිහින්, සුන්දර, මන්දගාමීව

18 <u>වැරදි</u> අක්ෂර වින්‍යාස රීතිය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සමාන රූපී වචනවල අර්ථයට අනුව 'ණ' හෝ 'න' යෙදේ.
(2) පාලි සංස්කෘත වචනවල ට,ය,ඩ,ඪ අකුරු සිංහල වචනවල දී 'ල' බවට පත් වේ.
(3) 'ෂ' අකුරට පසුව යෙදෙන්නේ, 'ණ' අකුර යි.
(4) 'ච' අකුරට පසුව 'ශ' යෙදේ.

**19 – 20 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

19(1) අප සියලු දෙනා ම තෙරුවන් සරණ ගියෙමු.
(2) සොරුන් වටිනාබඩු රැගෙන පැන ගියෝ ය.
(3) සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා!
(4) නුඹලා පොත් පාඩම් කළෙහි .

20(1) ආරාධිත අමුත්තෝ වේදිකාවේ අසුන් ගත්හ.
(2) පාට පාට මල් පරිසරය සුවඳවත් කරති.
(3) වනයේ මීමුන් අනෙකා සමග සටනට සැරසෙති.
(4) සියලු ගංගාවෝ එක්ව ගලයි.

ලකුණු 20× 2 = 40

11 කොටස

1,2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5 ට පමණක් පිළිතුරු සපයන්න.

01) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂර ගණන කීයද?
II. ඕෂ්ඨජ අකුරු 02 ක් ලියන්න.
III. 'ගස' යන්නට සමානාර්ථ පද දෙකක් ලියන්න.

IV. ‘ඔහුගේ අවමගුලට බොහෝ පිරිසක් පැමිණ සිටියහ.’ යන වාක්‍යයේ ඇති උපසර්ග පදය උපුටා ලියන්න.

V. ‘අනවශ්‍ය විස්තර කීම’ යන්නට යෙදිය හැකි රූඪියක් ලියන්න.

ලකුණු 5×2 = 10

02) පහත මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200 පමණ රචනාවක් ලියන්න.

I. පිරිසිදු පරිසරයක් ගෙනෙයි සුවබර ජීවිතයක්
II. හොඳ පොතපත සාරධර්ම උගන්වයි.
III. වැඩිහිටියෝ අපේ හොඳ ම මාර්ගෝපදේශකයෝ ය.
IV. එදා වැහිබර දිනයකි............

ලකුණු 20

03) කුරුණෑගල, මල්ලවපිටිය ,ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න. ඔබගේ ප්‍රදේශයේ පවතින දැඩි ජල අර්බුදය හේතුවෙන් ජනතාව අපහසුතාවකට පත් ව සිටී.මේ නිසා නගර සභාවේ ජල බවුසර් මගින් නිවාස සඳහා ජලය සපයා ගැනීමට සමිතියේ දී තීරණය විය.මේ ඉල්ලීම කරමින් කුරුණෑගල නගර සභාවේ ගරු නගරාධිපති තුමා වෙත යවන ලිපිය සකස් කරන්න.

ලකුණු 10

04) පෙළ පොතේ පාඩම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.(වරහන් තුළ සපයා ඇති තොරතුරු උපකාර කරගන්න.)

| | | |
|---|---|---|
| 1 | ස්ටීවන් හෝකින් | |
| 2 | | මග දිගට ජන කතා |
| 3 | එස්. පණීභාරත | |
| 4 | තනිව උච්චාරණය කළ හැකි ශබ්ද | |
| 5 | | එස්.මහින්ද හිමි |
| 6 | ශබ්දෝච්චාරණය ප්‍රගුණ කරන කෘතියකි. | |
| 7 | | ලංකා ඉතිහාසයේ අභිමානය නිරූපණය කරයි. |
| 8 | | වෙස්සන්තර ජාතක කාව්‍ය |
| 9 | කළු කුහර | |
| 10 | | උගුරෙන් උපදී |

(සකස්කඩ/භෞතික විද්‍යාව/දේශීය නර්තනයේ රන් සලකුණ /ඩී.පී වික්‍රමසිංහ/ලප සේ සඳ විලසේ/වටේ මහ මුහුදයි /කණ්ඨජ /ස්ටීවන් හෝකින් /ස්වර අක්ෂර/අපේ සංස්කෘතික උරුමය )

ලකුණු 10

05) පහත වචන යොදා නිවැරදි වාක්‍ය නිර්මාණය කරන්න.

1. නුවන  2.දණ  3.වනය  4.කුලුණු  5. කන

ලකුණු 10

06) ගැළපෙන අකුරු යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1 ත්‍යාග ප්‍ර..නය  2. ලේ...නය
3. කොට්ඨා...ය  4. ස්...පය
5. කැ..ණි  6. දක්...ණ
7. ආ...වාස  8. වි...මය
9. වි...වය  10.සමස්...

ලකුණු 10

# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය දෙකයි.**

නම / අංකය : ..................................................................... **9 ශ්‍රේණිය**

## I කොටස

*** සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01.අකුරක් හැඳින්වීමට නිවරදිම ප්‍රකාශය වන්නේ

1.රූපකයකි. 2.හැඩතලයකි. 3.ශබ්ද සංකේතයකි. 4.කල්පිතයකි.

02. නූතන සිංහල අක්ෂර මාලාවේ මහප්‍රාණ අක්ෂර ගණන වන්නේ

1.පහයි. 2. දහයයි. 3. අටයි. 4. දහ අටයි.

03. සෑම පදයකටම සඤ්ඤක අක්ෂරයක් යෙදුණු පද පේළිය වන්නේ

1. නළ,වනය,අඟ, නුබ
2. තඹ, ඇණය, ඥානය,කඳ
3. රඹ,සඳ,මඳ, සුළඟ
4. පහළ, වර්ණ, රජ, බඳ

04. අකුරු මනින ඒකකය හැඳින්වෙන්නේ

1. කැලරි 2. මාත්‍රා 3. පනම 4. පවුම නම්නි.

05. අග පදයෙහි අර්ථයන් සහිත යුගල පද වර්ගයට අයත් පදය වන්නේ

1. ඉමක් කොනක්
2. යාන වාහන
3. දඩස් බඩස්
4. රණ්ඩු සරුවල්

06. නිපාත පදයක් නොවන පදය

1. තෙක් 2. දක්වා 3. පටන් 4. තව

- ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරන්න.

07. නොදන්න දෙමළට ගිහින් ......................... නහ ගත්ත වගේ.

1. පවුල 2. වරිගෙ 3. දිවි 4. පණ

08. පය බරවායට ....................... බෙහෙත් බැන්දා වගෙයි.

1. හිසේ 2. කකුලේ 3. නළලේ 4. පිටිකර

- පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද කවර ව්‍යාකරණ වර්ගයකට අයත් දැයි තෝරන්න.

09. දරුව මෙහි එන්න.

1. මිශ්‍ර ක්‍රියා 2. විධි ක්‍රියා

3. පූර්ව ක්‍රියා 4. අසම්භාව්‍ය ක්‍රියා

10. අව්‍ය පද යනු

1.නිපාත පදයි. 2. උපසර්ග පදයි.

3. තද්ධිත පදයි. 4. නිපාත සහ උපසර්ග දෙකටම අයත් පදයි.

11. ප, ඵ, බ, භ, ම අක්ෂර අයත්වන කාණ්ඩය වන්නේ

1. දන්තජ 2. මූර්ධජ 3. ඕෂ්ඨජ 4. තාලුජ

- හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

12. ගංගා ගලා ..................

1. බසිති. 2. බසියි. 3. බසින්නෝය. 4. බසින්නාහ.

13.මින්......... ගංවෙරළට රැස්වෙති.

1.දද 2.පසු 3. අනතුරුව 4. රැල

14. තුරු පෙළ සුළඟට ...........

1. වැටෙති. 2.සෙලවෙති 3. ඇඹරෙති. 4.සෙලවෙයි.

15.සමානාර්ථ පද පමණක් ඇති පද පේළිය තෝරන්න.

1. කනක, කාංචන, සිංධු, කසුන් 2. තුරු,රුක්, දරිද්‍ර,දුම්දු

3. ප්‍රමෝදය,තොස,හර්ෂය,උදක 4. ජලය ,අඹ,උදක, දිය

16. අකාරාදි පිළිවෙලට වචන යෙදී ඇති වරණය තෝරන්න.

1.කතරගම,ගම්පහ,මහරගම,රත්මලාන 2.ජපානය,නයිජීරියාව,එංගලන්තය,ඇමරිකාව

3.වලසා,දළඹුවා,මයිනා,රිලවා 4.සමන්පිච්ච,රෝස, වතුසුද්ද,ඉද්ද

17.රජතුමා ගමන් කල දෝලාව රෝද නැති කරත්තයක් වගේය.

මෙහි සඳහන් උපමාව වන්නේ,

1.දෝලාව 2. කරත්තය

3.රෝදනැති කරත්තයක් 4.ගමන්කල දෝලාව

18. පෞරුෂත්වය යන පදයේ නිවරදි පිල්ලම් වන්නේ

1. කොම්බුව,ගයනුකිත්ත, ඇදය,ඉස්පිල්ල
2. කොම්බුව,ගයනුකිත්ත,පාපිල්ල,හල්කිරීම
3. කොම්බුව,ගැටපිල්ල,ඇදපිල්ල, ඉස්පිල්ල
4. කොම්බුව,ඇලපිල්ල, ඇදය ඇදපිල්ල

19. ඉහේ මලක් පිපුණා යන පදය

1.උපමාවකි  2.රූපකයකි.

3.නිපාතයකි.  4.රූඩී පදයකි.

20. උක්ත පද පමනක් යෙදී ඇති පද පේළිය වන්නේ

1. සමහරෙකු, වෙළෙන්දෙක්, මිනිසා, ඕ  2. ගැහැණියක්,තෝ, ළමයෙක්,ඔවුහු

3. සමහරු, ඇතමෙකු, අප,ගුරුවරයා  4. ශිෂ්‍යාවක, මිනිසෙක්, හාවෙක්, ඇය

(ලකුණු 2 x 20 = 40)

II කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01.ඔබේ සිංහල ගුරුතුමා ඔබේ පන්තිය කණ්ඩායම් පහකට බෙද බිත්ති පුවත්පතක් සැදීමට ඔබට පැවරුමක් ලබා දුන්නේයැයි සිතා එම ක්‍රියාකාරකම ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ එම බිත්ති පුවත් පතට යෙදූ නම කුමක්ද?

2. කණ්ඩායම් පහට ඔබ පැවරූ වැඩ මොනවද?

3. එහිදී ඔබ ට ඇතිවූ ගැටලු මොනවාද?

4.ඔබ ඒ සඳහා යොදගත් තේමාව කුමක්ද?

5. එම ක්‍රියාකාරකමෙන් ඔබ ඉගනගත් දෙයක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

02. කැමති මාතෘකාවක් තෝරාගෙන වචන 200ට නොඅඩු රචනාවක් ලියන්න.

1. ලොව මවිත කල විද්‍යාඥයෝ.

2. මම හොද මිණිසෙක් වී රටට සේවය කරමි.

3. විද්‍යාවේ දියුණුව නිසා.

4. ගැමි දිවිය සරු කල ජන කවි.

5. එය මට කිසිද අමතක නොවේ.  (ලකුණු 20)

03. මාරාන්තික කොරෝනා වෛරසය අසාදනය වීමෙන් වැලකීම සඳහා ප්‍රදේශවාසීන් දැනුම්වත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 15)

04. පෙලපොතේ උධෘත ඇසුරින් පිළිතුරු ලියන්න.

**i. "එයද කළ හැකි වන්නේ ඔබට පමණයි"**

1. මෙම ප්‍රකාශය කා විසින් කා හට කියන ලද්දක් ද? (ලකුණු 2)

2. මෙහි සඳහන් කලහැකි දෙය කුමක්ද? (ලකුණු 1)

3. මෙම කොටස ඇතුලත් පාඩම උපුටා ගත් පොත කුමක්ද? (ලකුණු 1)

**ii. "කට දහසක් ඇතුව කිවත් නුඹෙ ගුණ නැත නි මිමා**
**වට දහසක් ගව් හිමයේ ගියදෝ අපෙ අ මිමා"**

1. මෙම කවියේ මුල් පද දෙක ලියන්න. (ලකුණු 2)

**iii. "පුතේ මම බෙරේ කරේ දගෙන හැතැක්ම ගණන් පයින් ගිය කෙනෙක්"**

1.මෙසේ පයින් ගිය ශ්‍රේෂ්ඨ පුද්ගලයා කවුද? (ලකුණු 1)

2. ඔහු හැදින් වූ විරුද නාමය ලියන්න. (ලකුණු 1)

05. පහත සඳහන් පද්‍ය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

කරුණා මහිම කොයි තරමද කිවොත් ඔබේ
මැවුණා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුනොත් මොබේ
මරනාසන්න හුස්මට මුත් ආසි ලැබේ

1. මහා ගංගාවල් මැවී ඇත්තේ කුමක් නිසාද? (ලකුණු 2)

2.මහිම ආසි යන පදවල තේරුම ලියන්න. (ලකුණු 2)

3. මෙහි අගපද දෙකෙහි තේරුම ඔබේ වචනෙන් ලියන්න. (ලකුණු 2)

4. කිවොත් යන පදය අයිති ව්‍යාකරණ වර්ගය කුමක්ද? (ලකුණු 1)

(ලකුණු 15)

# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2019
## First Term Test - 2019

සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II
Sinhala Language & Lit - I, II

කාලය පැය 2යි.

නම :- ............................................ විභාග අංකය :-

9 ශ්‍රේණිය

## I කොටස

• ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) නූතන සිංහල වර්ණමාලාවට අයත් ස්වර ගණන.
(i) 20 කි. (ii) 18 කි. (iii) 60කි. (iv) 30කි.

(02) කණ්ඨජ අකුරු පමණක් ලැබෙන වචනය තෝරන්න.
(i) කළුතර (ii) කතරගම (iii) කටුගොඩ (iv) කාක්කා

(03) විරුද්ධාර්ථවත් යුගල පදය ඇතුළත් වරණය වනුයේ,
(i) යාම් ඊම් (ii) ලියුම් කියුම් (iii) හැඩිලි දෙඩිලි (iv) සිතුම් පැතුම්

• නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වරණය තෝරන්න.

(04) (i) මර්ධනය (ii) මර්දනය (iii) මර්දණය (iv) මර්ධනය

(05) (i) ධර්මිෂ්ට (ii) දර්මිෂ්ඨ (iii) ධර්මිශ්ට (iv) ධර්මිෂ්ඨ

• හිස්තැනට සුදුසු වචනය තෝරා දී ඇති ප්‍රස්තාපිරුළ සම්පූර්ණ කරන්න.

(06) කණ කොකාගේ ..................... පේන්නේ ඉගිලෙන විටලු
(i) පිහාටු (ii) ඇස් (iii) සුදු (iv) කළු

• ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන පිළිතුර වනුයේ,

(07) සමාජ විරෝධී කටයුතු සඳහා <u>උල්පන්දම් දීම</u> නොමනා ක්‍රියාවකි.
(i) උපදෙස් දීම (ii) සහය දීම (iii) සවන් දීම (iv) අනුබල දීම

(08) <u>අහස් මාලිගා</u> තැනීම දියුණුවට අහිතකරය
(i) නොලැබෙන දේ ගැන සිහින මැවීම.
(ii) අහසේ මාලිගා තැනීමට හැකි බව.
(iii) අනුන්ගෙන් උදව් ඉල්ලා සිටීම.
(iv) අහසේ මාලිගා තැනීම සිහිනයක් බව.

• මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථවත් පදය තෝරන්න.

(09) බහුශ්‍රැත (i) නිපන (ii) ජනශ්‍රැති (iii) අල්පශ්‍රැත (iv) ප්‍රවීන

(10) මුග්ධ (i) විදග්ධ (ii) මෝඩ (iii) අඩඟු (iv) උපායශීලී

• මුලින් දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න.

(11) ප්‍රභාතය (i) ප්‍රභාෂ්වර (ii) උදෑසන (iii) බැවුම (iv) රාත්‍රිය

(12) අරවින්ද (i) ඉද්දමල (ii) පිච්චමල (iii) නෙළුම් මල (iv) ඕලු මල

(අනෙක් පිටුව බලන්න.)

(13) යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(i) අටුකොටු, අඟහිඟ, අනම්මනම්, අතන මෙතන

(ii) ඉවුම් පිහුම්, ඉහනිකට, ඉවක් බවක්, ඉඩම් කඩම්

(iii) වගතුග, වන්න හුන්න, වතුපිටි, වසවිස

(iv) කසිලි බිසිලි, කඩ වීදිය, කඩිමුඩි, කයි කතන්දර

(14) ඉරි ඇඳි පදය අයත්වනුයේ කවර ව්‍යාකරණ ගණයකටද?

ඇය ගැයූ ගී <u>සුමිහිරිය</u>

(i) නිපාතයකි. (ii) ක්‍රියාපදයකි. (iii) උපසර්ග පදයකි. (iv) නාම පදයකි.

- හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(15) කුරුල්ලෝ අහසේ පියාසර ..................................

(i) කරයි. (ii) කරති. (iii) කළේය. (iv) කරන්නීය.

(16) පනීභාරතී මහතා දේශීය නර්තනයට විශාල සේවාවක් සිදු ............................

(i) කළේය (ii) කරන්නීය (iii) කළහ. (iv) කරති

(17) අයෙක් සතුටු සාමීචියේ යෙදී ........................

(i) සිටියේය (ii) සිටින්නීය (iii) සිටියි (iv) සිටිති

- දී ඇති අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(18) සිත් ඇදගන්නා සුළු

(i) චිත්තාකර්ෂණීය (ii) සිතක මහිම

(iii) සිතට දැනෙන නිදහස (iv) සිතෙහි වෙනස්වන බව

(19) රනින් කරන ලද

(i) රජතමය (ii) ස්වර්ණමය (iii) රිදීමය (iv) ශෛලමය

(20) තම දේශය පිළිබඳ ඇති අභිමානය

(i) භක්තිය (ii) ආදරය (iii) දේශාභිමානය (iv) ගෞරවය

(ලකුණු 2 x 20 = 40)

(අනෙක් පිටුව බලන්න.)

# II කොටස

- සියලුම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

**(01)** පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. මනමේ නාට්‍යයේ සඳහන් ප්‍රධාන චරිත දෙකක් නම් කරන්න.
ii. කොග්ගල මහා ප්‍රාඥයා යන නමින් හඳුන්වනු ලැබුවේ කවුරුන්ද?
iii. කෝට්ටේ යුගයේ රචිත උපදේශ කාව්‍යයක් නම් කරන්න.
iv. මනමේ නාට්‍ය රචනා කරනු ලැබුවේ කිනම් ජාතක කථාවක් පදනම් කරගෙනද?

(ලකුණු 5 x 2 = 10)

**(02)** දී ඇති මාතෘකා අතුරින් එකක් තෝරාගෙන රචනාවක් ලියන්න.

i. පරිසරය සුරකිමු.
ii. කසළ හිසරදයක් නොව සල්ලි මවන නිධානයකි.
iii. අපේ ආහාර අපේ සවියෙන්
iv. මාර්ග අනතුරු වළකාගනිමු.

(ලකුණු 20)

**(03) 9** ශ්‍රේණියේ සිසුන් සඳහා සංවිධානය කරන ලද අධ්‍යාපන චාරිකා සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ නිසි අවසර ලබාගත යුතුව ඇත. මෙම චාරිකාවේ ප්‍රධාන සංවිධායක ඔබ යයි සිතා අවසර ඉල්ලීමේ එම ලිපිය ඔබ විසින් සකස් කරන්න.

(ලකුණු 15)

**(04)** පහත ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

"මට වන්දනා කරන්න බැරිවුයේ ශ්‍රී පාදය පමණයි."

**i.** ඉහත ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන්ද?
**ii.** ඉහත ප්‍රකාශය සිදු කිරීමට ඉවහල් වූ අවස්ථාව කෙටියෙන් ලියන්න.
**iii.** එම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන්ද?
**iv.** මෙම කථාව උපුටාගනු ලැබුවේ කිනම් කෘතියකින්ද?
**v.** ඔබ දන්නා වෙනත් ජාතක කතාවක් නම් කරන්න.

(ලකුණු 05)

**(05)** සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

**i.** මුළු රාත්‍රියම ................................ තුළ නිදිවර්ජිත ව රැඳී සිටින ගොවියා .......................... ගොයම සතුන්ගෙන් ආරක්ෂා කරයි. (පැළ/ වල)
**ii.** මග සලකුණු නොදැන .....................ට ගිය පිරිස බොරු................. ක වැටී අනතුරට පත්වූහ. (වල/වළ)
**iii.** සැදැහැවත් ................ භික්ෂූන් වහන්සේට ...................... නමා වැන්දෝය. (දණ/දන)
**iv.** .................... අලියාගේ එක් කකුළක් .................... වී ඇති අයුරු වෛද්‍යවරයාගේ අවධානයට ලක්විය. (වන / වණ)
**v.** ......................... ආරාධිත අමුත්තා ත්‍යාග .......................යට සහභාගී විය. (ප්‍රධාන/ ප්‍රදාන)

(ලකුණු 2 x 5 = 10)

**බප/පිළි/සාන්ත ජෝන් විද්‍යාලය, නුගේගොඩ**

**පළමුවන වාර පරීක්ෂණය - 2020**

**9 ශ්‍රේණිය - සිංහල භාෂාව හා සාහිත්‍ය - I හා II පත්‍රය**

කාලය පැය 02

නම :   අංකය :

---

* පළමුවන කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**I කොටස**

* පහත සඳහන් වාක්‍ය වල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ග්‍රාමසේවක මහතාගේ වැඩ <u>ගොළුබෙලි ගමනින්</u> සිදුවන බව අම්මා කීවාය.

i) ඉතා නිහඬව   ii) ඉතා සෙමෙන්

iii) ඉතා කඩිසරව   iv) ඉතා ඕනෑකමින්

02. විභාග ප්‍රතිඵල එනතුරු සුනිමල් <u>ඇඟිලි ගනිමින්</u> සිටියි.

i) ඇඟිලි ගණන් කරමින්   ii) ඇඟිලි කීයක් තිබේදැයි

iii) නොඉවසිල්ලෙන්   iv) උදාසීනව

03. අද ගණිතය ප්‍රශ්න පත්‍රය <u>කජු කන්න වගේ</u> යැයි ප්‍රගීත් කීවේය.

i) කජු කන විට ලිවිය හැකි බව   ii) අනවශ්‍ය ගැටළු ඇතිබව

iii) ඉතා අමාරු බව   iv) ඉතා පහසු බව

04. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය වරණය වන්නේ

i) පුස්ථකාලය   ii) ත්‍යාග ප්‍රදානය

iii) වර්ධනය   iv) කොට්ඨාශය

05. සිංහල අක්ෂර මාලාවේ ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර

i) ප , ඵ , බ , භ , ම   ii) ත , ථ , ද , ධ , න

iii) ප , ඵ , ට , ඨ , ල   iv) ක , ච , ට , ත , ප

06. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදය ඇතුලත් වරණය තෝරන්න.

i) සතුට - ප්‍රබෝදය , සොම්නස , ප්‍රීතිය , ප්‍රහර්ෂය

ii ) පිපි - විකසිත , පිබිදී , මිණිමුතු , පුබුදු

iii) ගස - තරු , රුක , සාදප , වෘක්ෂය

iv) ජලය - පැන් , උදක , අඹ , රඹ

07. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදය තෝරන්න.

i) සරු - නිසරු   ii) චල - අචල

iii) මඟුල් - අවමඟුල්   iv) රහිත - විරහිත

08. නොගැළපෙන යුගල පදයක් සහිත පිළිතුර තෝරන්න.

i) මුදල් හදල් , ඔප්පු තිරප්පු , රොඩු බොඩු

ii) අඟර දඟර, ලට්ට ලොට්ට, අබල් ඩබල්

iii) මිල මුදල් , ලවක් දෙවක් , සමිති සමාගම්

09. ඕෂ්ඨජ අක්ෂර ඇතුළත් නොවන වචනය තෝරන්න.

i) තාලම්පට ii) ගැට බෙරය iii) මද්දලය iv) හක්ගෙඩිය

10. රේඵය , රකාරාංශය , ගයනුකිත්ත , යංශය පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ

i) භ්‍රමණය, කර්මය, ඖෂධ, සාහිත්‍ය ii) ධර්මය, ග්‍රහණය, පෞරුෂය, සත්‍ය

iii) මධ්‍යම, වෛරස, ලෞකික, සෞක්‍යය iv) ප්‍රමාණය, ව්‍යායාම, ලේඛන, අසත්‍ය

11. උක්ත පද පමණක් ඇතුළත් පිළිතුර

i) මම, අයෙක්, නුඹලා, තොප ii) ගොවියෙකු, ඇතැමෙක්, මා, අප

iii) බල්ලො, දරුවෝ, ගොවියන්, ඔහු iv) නරියෙක්, මිනිසෙක්, අපි,තොපි

12. නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් යෙදී ඇති වාක් වාක්‍ය තෝරන්න.

i) උස ළමයා පොල්තෙල් පහන දල්වයි.

ii) හේන් ගොවියෝ උනන්දුවෙන් වගා කටයුතුවල යෙදෙති.

iii) හොඳ දරුවා මල් පූජා කරයි.

iv) සුන්දර උදෑසන කුරුල්ලෝ පියාඹති.

13. නිත්‍ය බහු වචනයක් යෙදී නැති වාක්‍ය තෝරන්න.

i) ඇතැමෙක් ගී ගයති. ii) සමහරෙක් ගොයම් කපති.

iii) මිනිසෙක් උස ගස් කපයි. iv) අයෙක් ආහාර ගනිති.

ප්‍රශ්න අංක 14, 15, 16 වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය වරහන් තුලින් තෝරා ලියන්න.

14. වෛද්‍යවරයා අසරණ _________ සුවපත් කරයි.

i) රෝගියෙකු ii) රෝගීහු iii) රෝගියෙක් iv)රෝගියෝ

15. පාරේ එක් කෙනෙක් ගමන් _______ .

i) කරති ii) කරහු iii) කරහි iv) කරමු

16. පියුම්හු පොකුණ අලංකාර _______ .

i) කරයි ii) කරන්නීය iii) කරති iv) කරහි

17. මධ්‍යම පුරුෂ නාම පදයක් ඇතුළත් පිළිතුර වන්නේ

i) මම, අපි, ඇය, ඔවුහු ii) තාත්තා, බාප්පා, ඔවුන්, මා

iii) ඔවුහු, මාමා, අප, ඈ iv) මම, අප, නුඹ, අපි

18. ආශිර්වාද ක්‍රියාව, මිශ්‍ර ක්‍රියාව, පූර්ව ක්‍රියාව, විධි ක්‍රියාව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ

i) දුවමින්, නවතින්න, ගොස්, ජයවේවා    ii) ගොස්, නවතින්න, ජයවේවා, දුවමින්

iii) ජයවේවා, දුවමින්, ගොස්, නවතින්න    iv) නවතින්න, ගොස්, ජයවේවා, දුවමින්

* 19, 20 ප්‍රශ්න සදහා මුලින් දී ඇති පදයට ගැළපෙන පිළිතුර තෝරන්න

19. රංචුව ( සමූහාර්ථවාචී, නිපාත, තද්ධිත, උපසර්ග )

20. අවලස්සන ( නිපාත, උපසර්ග, තද්ධිත, සමූහාර්ථවාචී )

## II කොටස

1, 2, 3 ප්‍රශ්න අනිවාර්ය වේ. 4, 5, 6, 7 ප්‍රශ්න වලින් කැමති ප්‍රශ්න **දෙකකට** පිළිතුරු ලියන්න.

01. සාම්ප්‍රදායික යෙදුම් යන මාතෘකාව යටතේ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සාදන ලද පොත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i) ඔබ පොතට යෙදු නම කුමක්ද? (ල. 02)

ii) ඔබට පැවරුණු කාර්යය වාක්‍යයකින් ලියන්න. (ල. 02)

iii) පොත සැකසීම සඳහා ඔබ කරුණු සොයාගත් මාධ්‍ය දෙකක් ලියන්න. (ල. 04)

iv) පොත සකස් කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න. (ල. 04)

v) පොත සකස් කිරීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන 4ක් ලියන්න. (ල. 04)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න

i) ජන කවියයි ගැමි දිවියයි.
ii) හැදුනොත් හොඳට හැදී දෙවියොත් නමට වඳී.
iii) එකට එක් වෙමු. රටම සුරකිමු .
iv) ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත්වලින් පොහොසත් රටකි.

03. අ/බෝගහවැව මහකනදරාව විද්‍යාලයේ ක්‍රීඩාවට දක්ෂ දරුවන් රැසක් සිටියත් ක්‍රීඩා පිටියක් නොමැතිවීම නිසා ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා එය මහත් ගැටළුවකි. මේ සඳහා පිළියමක් ලෙස විද්‍යාලය ආසන්නයේ ඇති වල් බිහිවී ඇති ඉඩම පාසලට පවරාගෙන ක්‍රීඩා පිටියක් බවට පත් කර දෙන ලෙස ඉල්ලා කැබිතිගොල්ලෑව කලාප අධ්‍යක්ෂක තුමා ට යවන ලිපිය ලියන්න. ඔබ විදුහල්පති D. K. සමර වික්‍රම යැයි සිතන්න.

04. ඇසේ මතුවන කඳුළු බිඳුගෙන
ඔබේ සිරිපා දොවන්නම්
හදේ මැලවෙන කැලෑ මල් ගෙන
ඔබේ සිරිපා පුදන්නම්

නොඅදහා බුදු කෙනෙකු දෙවියෙකු

මානයෙන් වල්මත්ව සිටි මම
ගලක් යැයි ඔබ සිතා සිටියෙමි
තෙතක් හෝ කිසි දයාවක් නැති
ගලින් කළ ඔබ හදින් වෑහෙන
මහා කරුණා ගුණය නොපෙනිණි

i) මෙම නිර්මාණය සඳහා මාතෘකාවක් යොදන්න.

ii) මෙම නිර්මාණය තුළින් මතුවන වටිනා ගුණාංග දෙකක් ලියන්න.

iii) පද්‍ය කොටසෙහි සඳහන් අනුක්ත නාම පද දෙකක් ලියන්න.

iv) මෙහි සඳහන් උත්තම පුරුෂ සර්වනාම පදයක් ලියන්න.

v) මෙම පද්‍යය කොටස පිළිබඳ ඔබට හැඟෙන අදහස වාක්‍ය දෙකකින් ලියන්න.

(ල. 10)

05. ප්‍රශ්නාර්ථය, කොමාව, දෙතිත, යුගල උඩු කොමා, වරහන යන විරාම ලක්ෂණ යොදා වාක්‍ය පහක් වෙන් වෙන්ව ලියන්න. (ල. 2 x 5 = 10)

06. පෙළ පොතේ පාඩම් ඇසුරින් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

i) ශ්‍රී පාදය වැන්ද වූ හැටි පාඩම උපුටා ගත් ජනකතා කෘතියේ නම ලියන්න.

ii) ලප සේ සඳ විලසේ කාව්‍ය පන්තිය කුමන කාව්‍යයකින් උපුටා ගන්නා ලද්දක් ද?

iii) ස්ටීවන් හෝර්කින් ආචාර්ය උපාධිය සඳහා තෝරාගත් විෂය ක්ෂේත්‍රය කුමක්ද?

iv) ස්ටීවන් හෝර්කින්ට හිමි වු සම්මාන දෙකක් ලියන්න.

v) “මම බෙරේ කරේ දාගෙන හැතැප්ම ගණන් පයින් ගිය මිනිහෙක්” ඉහත ප්‍රකාශය කාගේද?

(ල. 2 x 5 = 10)

07. පහත දැක්වෙන පද්‍ය නිර්මාණ කොටස්වල කතුවරුන් නම් කරන්න.

i) මල් පිපෙන පොකුණ ද - කඳු ගං කැලෑ කුඹුරු ද

ii) මගෙ රට මගෙ දැය නිසා - යුද වැද සතුරන් නසා

iii) හිරු රැස් නාමින් නෙළුම් පිපීලා - පොකුණ හිනා වෙනවා

iv) ඇසෙයි අලුයම් දුරේ - තේවාවෙ හේවිසිය

v ) කරුණා මහිම කොයි තරම ද කීවොත් ඔබේ
මැවුනා මහ ගං ගෙවල් ලෙසින් ඉබේ

(ල. 2 x 5 = 10)

ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 09 | විෂයය Subject } සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය Paper } I.II | කාලය Time } පැය 02 |

නම :- ..................................................................................... පංතිය :- ..........................

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

### I කොටස

1) ත්‍රස්ත ප්‍රහාරයත් සමග ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ <u>බහින කලාව</u> ආරම්භ විය.
   I. කරදර පිට කරදර.
   II. ආදායම පහල වැටීම.
   III. අනවශ්‍ය විස්තර කිරීම.
   IV. ගෞරවය නැති වී යෑම.

2) ඔහුගේ මාගේ දියුණුවට <u>අකුල් හෙළනවා</u> සේ මට දැනේ.
   I. 1.අතු කඩා දමනවා.
   II. 2.බාධා කරනවා.
   III. 3.සහයෝගය දීම.
   IV. 4.සංවිධානය කිරීම

3) 'වැරදි තීරණයක් දීම හා අනුන් ලවා තමාගේ තීරණ ක්‍රියාත්මක කිරීම' යන අරුත් ඇති ප්‍රස්ථා පිරුළු වන්නේ,
   A. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ.
   B. බල්ලාගේ වැඩේ බූරුවා බාර ගත්තා වගේ.
   C. ගමරාළගේ වං ගෙඩිය වගේ.
   D. බළලුන් ලවා කොස් ඇට බැව්වා වගේ.

   I. A හා D II.C හා B III. A හා C IV.B හා D

4) මුලින් දී ඇති පදයට සමානාර්ථ නොදෙන පද ඇතුළත් පිළිතුර තෝරන්න.
   I. සඳ - චන්ද්‍ර , තරුපති , තාරපති
   II. විශාල - විසල් , මහත් , තුමුල
   III. ජලය - පැන් , උදක , අඹ
   IV. ගස - තුර , රුක , සෙවණ

5) දී ඇති පද දෙකෙහි විරුද්ධාර්ථය දැක්වෙන පද දෙක සහිත වරණය තෝරන්න.

ඝෝෂ , ශබ්ද

I. නිසංසල , ඝෝෂ
II. නිශ්චල , කලහකාරි
III. අඝෝෂ , නිශ්ශබ්ද
IV. නිසරු , නිදොස්

6) තාලුජ අක්ෂර පමණක් ඇති පිළිතුර තෝරන්න.

I. ච,ඡ,ජ,ඣ,ඤ
II. ක,ඛ,ග,ඝ,ඞ
III. ත,ථ,ද,ධ,න
IV. ප,ඵ,බ,භ,ම

7) අක්ෂර වින්‍යාසය නිවැරදි ලෙස යොදා ඇති පිළිතුර තෝරන්න.

I. ප්‍රාශ්වාස,දෘෂ්ටිය,සමස්ත
II. ප්‍රශ්වාස,දෘෂ්ටිය,සමස්ත
III. ප්‍රශ්වාශ,දෘශ්ටිය,සමස්ථ
IV. ප්‍රස්වස,දෘස්ටිය,සමශ්ථ

8) ක්‍රියා රූප දෙකක් එකතු කිරීමෙන් සැකසුණු යුගල පද වන්නේ,

I. නැටුම් - ගැයුම්
II. අඟර - දඟර
III. ලට්ට - ලොට්ට
IV. රොඩ්ඩු - බොඩ්ඩු

9) පහත සඳහන් ඉරි ඇඳි පද කුමන වර්ගයට අයත් දැයි තෝරන්න.

මා දුටු <u>**බියකරු**</u> සිහිනය මා කෙසේ නම් ප්‍රකාශ කරන්නද,

I. ක්‍රියා විශේෂණයකි.
II. නාම විශේෂණයකි.
III. නිපාත පදයකි.
IV. උපසර්ග පදයකි.

10) පොලිස් නිලධාරියාගේ <u>**කාරුණික**</u> හැසිරීම මා මවිතයට පත් කරයි.

I. නාම විශේෂණයකි.
II. ක්‍රියා විශේෂණයකි.
III. උපසර්ග පදයකි.
IV. අසම්භාව්‍ය ක්‍රියාවකි.

11) සතුරා විනාශ <u>**කරව්.**</u>

I. විධි ක්‍රියා   II. මිශ්‍ර ක්‍රියා   III. ප්‍රයෝජ්‍ය ක්‍රියා   IV. අසම්භාව්‍ය ක්‍රියා

12) අම්මා උදෑසන <u>නැගිට</u> කිරිබත් පිසුවාය.

I. විධි ක්‍රියා
II. පූර්ව ක්‍රියා
III. ප්‍රයෝජ්‍ය ක්‍රියා
IV. අසම්භාව්‍ය ක්‍රියා

13) මල්ලී **<u>හඬමින්</u>** බත් කයි.

I. විධි ක්‍රියා.
II. මිශ්‍ර ක්‍රියා.
III. පූර්ව ක්‍රියා.
IV. අසම්භාව්‍ය ක්‍රියා.

•ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය යටින් ඉරක් අඳින්න.

14)

I. ඔවුහු ක්‍රීඩා කරයි.
II. සුළඟ හමයි.
III. බල්ලා බිරූහ.
IV. තුරු සුළඟට සෙලවෙති.

15)

I. මුහුදු රළ ගොඩබිමට ගලති.
II. කොඩි පෙළ සුළඟේ සසල වෙති.
III. ගිරා රෑන හේනේ ලැගුම් ගත්හ.
IV. කුරුලු පෙළ අහසේ පියාඹති.

16)

I. විශාඛාවෝ ආරාමයක් පූජා කලහ.
II. සුජාතාවෝ කිරිපිඩු දන් පිරිනමයි.
III. තෙරහු පිඩුසිඟා වඩියි.
IV. වෘක්ෂයෝ සුළඟට සෙලවෙයි.

17)

1) නුඹලා සිහිනයක් දුටුවෙහු.
2) කිරිල්ලී කැදලි තනති.
3) නුඹලා පාඩම් කළෙහි.
4) නංගී මල් නෙලන්නීය.

• **පහත වාක්‍ය වල ඉරි ඇඳි කොටස් අයත් පද වර්ගය වන්නේ,**

18) හෙට <u>සිට</u> අලුත් ලෝකයක් දකිමු.

I. නාම පද II. ක්‍රියා පද III. නිපාත පද IV. උපසර්ග පද

19) ආහාර ලබා ගැනීම සඳහා **<u>අනුපිළිවෙලට</u>** පැමිණෙන්න.

I. නාම පද  II. ක්‍රියා පද  III. නිපාත පද  IV. උපසර්ග පද

20) **<u>නිමල්</u>** මාගේ හොඳම මිතුරාය.

I. නාම පද  II. ක්‍රියා පද  III. නිපාත පද  IV. උපසර්ග පද

## II කොටස

- **•පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න..**

1) පන්ති කාමරයේදී ඔබ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස නිම කළ පොත් පිංචක් සැදීමේ ක්‍රියාකාරකම ඇසුරින් පිළිතුරු සපයන්න.

I. ඔබ සැකසූ පොත් පිංච කුමන මාතෘකාවක් යටතේ නිර්මාණය වූවක් ද?
(ලකුණු 01)

II. එම ක්‍රියාකාරකම කිරීමට පෙර ඔබට ගුරුතුමා දුන් උපදෙස් දෙකක් ලියන්න.
(ලකුණු 04)

III. එම පොත් පිංච සකස් කිරීමේදී ඔබට ඇති වූ ගැටලු දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 04)

IV. එම ගැටලු මගහරවා ගැනීමට ඔබ ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
(ලකුණු 04)

V. එහි අඩංගු කරුණු 3ක් ලියන්න.
(ලකුණු 03)

**(මුළු ලකුණු 16)**

2) පහත සඳහන් **අ,ආ,ඇ,ඈ** කොටස් වලින් එකක් තෝරාගෙන වචන **200** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.සුදුසු මාතෘකාවක් යොදන්න.

(අ). ලෝකයේ තාක්ෂණික දියුණුවත් සමග මිනිසා බොහෝ දේ සොයා ගත්තද ස්වභාවධර්මය සඳහා සුදුසු විකල්පයක් ඉදිරිපත් කිරීමට මිනිසා අපොහොසත් වී ඇත. එ නිසා ස්වභාවධර්මය රැක ගැනීම අප සතු යුතුකමකි.

(ආ). ගෙවතුවගාව කාර්මීකරණයත් සමග ක්‍රමයෙන් ගැමි ජීවිතයෙන් ඈත් වී ඇත.තම පවුලේ පරිබෝජනයට අවශ්‍ය එළවළු,පලතුරු,පලා වර්ග තම ගෙවත්තේ වගාකිරීම මුදල් ඉතිරි කිරීමක් මෙන්ම සතුට ඇති කරන්නක් ද වේ. එම නිසා ගෙවතුවගාව ප්‍රවර්ධනය කිරීමට රජයේ මැදිහත් වීම කාලීන අවශ්‍යතාවයකි.

(ඇ). කොරොනා වසංගතය ලෝක ප්‍රජාව බිලිගනිමින් පවතී. අද වනතුරු ඒ සඳහා නිශ්චිත ඖෂධයක් නිපදවීමට ලෝක බලවතුන් ද සමත් වී නැත.සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව මෙම වසංගතය මර්දනය කිරීම සඳහා ගත් පියවර ලෝක සෞඛ්‍ය සංවිධානයේද පැසසුමට ලක් වී ඇත.

(ඈ). දිනෙන් දින අසන්නට ලැබෙන අපරාධ පිලිබඳ තොරතුරු අපට කියාපාන්නේ සමාජයේ පවතින නොදියුණු බවයි. ආර්ථික ප්‍රශ්න මෙන්ම මිනිස් සම්බන්ධතා පිළිබඳ ගැටලු ද මෙයට ඉවහල් වි ඇත. අපරාධ මර්දනයට එකාමෙන් පෙළ ගැසීම කාලෝචිත වේ.

**(මුළු ලකුණු 14)**

3) පහත සඳහන් කවි හා ගීත කොටස් සම්පූර්ණ කරන්න.

i. සිය පිරිවර රටතොට හැම වස්තුවක්ම නැති නි මිමා

..............................................................................

තුරු පිරිවර පුත් සද මෙන් වන මැද උන්නෙ මිමා

.................................................................................

උපුටාගත් ග්‍රන්ථය - .......................

II. මගේ රට මගේ දැය නිසා

.......................................

මදිවී ගියත් මට එපා

.......................................

රචකයාගේ නම - ......................

III. මල් මල් වාරම් හරි මෑ උදාරම්

ගයවා ගයවා ගුවනේ

.............................................

.............................................

රචකයාගේ නම - ......................

IV. වටේ මහ මුහුදයි

සීතල සුළං විහිදයි

............................

.............................

රචකයාගේ නම - ......................

**(ලකුණු 2 1/2×4 = 10)**

4) පහත සඳහන් උදෘතයන් **කවුරුන් විසින් කාහට,කුමන අවස්ථාවේ** ප්‍රකාශ කරන ලද්දක් දැයි ලියන්න.

a. "මැණියනි, මම ඔබව ශ්‍රී පාදයට කැදවාගෙන යමි".

i. කවුරුන් විසින් - ..................................
ii. කා හට - ..................................
iii. කුමන අවස්ථාවේදී ද - .........................
iv. උපුටාගත් කෘතිය - .............................

1) "දරුවනි මම ලංකාවේ බොහෝ වෙහෙර විහාර වන්දනා කළෙමි".

   i. කවුරුන් විසින් - ..................................
   ii. කා හට - ..................................
   iii. කුමන අවස්ථාවේදී ද - ........................

2) "අද අපිට විශේෂ දවසක් ඒ මේ කලායතනයේ දරුවන්ට සම්මාන ලැබීමක්"

   i. කවුරුන් විසින් - ..................................
   ii. කා හට - ..................................
   iii. කුමන අවස්ථාවේදී ද - ........................

**(ලකුණු - 10)**

5) සුදුසු විරාම ලකුණු යොදන්න.

ඔබට නිරෝගී සුව අත්වේවා යනුවෙන් සදහන් වූ කාඩ් පත මා මවිතයට පත් කරවීය ඉකුත් මාසයේ සිට අධික රුධිර පීඩනය රුධිරයේ සීනි මට්ටම වැඩි වීම ආතරයිටිස් නැමත් සන්ධි රෝගයෙන් මම පෙළුනෙමි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යන්හී පූර්ණ කාලීන මාධ්‍යවේදීයෙකු වශයෙන් මෑතක් වෙන තුරුව කටයුතු කළෙමි මාගේ වැඩමුරය දිනපතා පෙව 6 30 ට ආරම්භ වේ

**(ලකුණු - 10)**

6) පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීම සදහා ඔබගේ තොරතුරු ඇතුළත් කරමින් අකෘති පත්‍රයක් සකස් කරන්න. **සැ.යු** - නම, පංතිය, ඇතුලත්වීමේ අංකය, පංතිභාර ගුරුභවතාගේ නම ආදිය ඇතුළත් විය යුතුය.

**(ලකුණු -10)**

# මීගමුව අධ්‍යාපන කලාපය

## 09 ශ්‍රේණිය ඃ සිංහල භාෂාව හා සාහිත්‍යය

## පුනරීක්ෂණ අභ්‍යාස මාලාව - පළමු වාරය

**01) පහත දැක්වෙන ප්‍රකාශ ඇතුළත් ව ඇති පාඩමේ නම සහ කවුරුන් විසින් කා හට කියන ලද දැයි ලියන්න.**

01) “ දරුවෙනි, මම ලංකාවේ බොහෝ වෙහෙර විහාර වන්දනා කළෙමි.”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

02) “ ගියොත් ආපසු එන්ට ලැබේ යයි සිතිය නො හැකි ය.”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

03) “ ගමනේ දුෂ්කර කොටස ඇත්තේ ඉදිරියට ය.”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

04) “ අද ම මගේ සහෝදරයන් දෙදෙනාට මා ලත් වස්තුව බෙදා දෙමි.”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

05) “ මම බෙරේ කරේ දාගෙන හැතැප්ම ගණන් පයින් ගිය කෙනෙක් ”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

06) “ විභාග දෙපාර්තමේන්තුවේ සියලු කාර්යයන් ඩිජිටල්කරණය කෙරේ ”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

07) “ කා කුමක් කීවත් සිය බස කෙලෙසා අපට නිදහසක් නො ම ලැබේ. ”

පාඩමේ නම ඃ ……………………………………………………………………………

…………………………………… විසින් ……………………………………

**02) පහත දැක්වෙන පදවල අරුත් පහදන්න.**

01) රූපශෝභිනියක් - ......................................
02) කාලක්‍රියා කළෙන් - ....................................
03) අටළොස්වියට - .......................................
04) ආසාව පසිඳලමි - ....................................
05) පර්වත ශිඛරයක් - ....................................
06) සන්තානයෙහි - ........................................
07) ලප සේ සඳ විලසේ - ................................
08) සදෙව් ලොව - .........................................
09) පටිසන්ථාර - ......................................
10) දැය - ...............................................
11) විජය දද - ........................................
12) මුදුනත් නගමින් - ..............................
13) හෙළ මල් - ........................................
14) රතඹල - ..........................................
15) උදුල - .............................................
16) දිය කඳුරු - .....................................

**03) පහත දැක්වෙන පදවලට සමාන පද සතරක් (04ක්) බැගින් ලියන්න.**

01) චන්ද්‍රයා = ........................../........................../........................../...................
02) පිපි = ........................../........................../........................../.........................
03) විශාල = ........................../........................../........................../.....................
04) රන් = ........................../........................../........................../.........................
05) මුහුද = ........................../........................../........................../.......................

**04) පහත දැක්වෙන පදවලට අනුරූප විරුද්ධ පදය බැගින් ලියන්න.**

01) දෝෂ = .......................................
02) ඝෝෂ = ......................................
03) කවි = ........................................
04) දිටු = ..........................................
05) පුරිස් = .......................................
06) ප්‍රතිපත්ති = ..................................
07) ශීල = ..........................................
08) යෝග්‍ය = ....................................
09) බහුශ්‍රැත = ..................................
10) ආධුනික = ....................................

**05) පහත දැක්වෙන කවිවල ඉතිරි පද පේළි සම්පූර්ණ කරන්න.**

01) ''සැට දහසක් රජුන් මැදේ ඉපිද සොඳේ අම්මා
රට දහසක්වල බැලුවත් නුඹ සේ නුදුටිම්මා
.........................................................................................
.........................................................................................''

02) ''.........................................................................................
අඳුන් තෙලින් නිති සරසා ඇති කළ දැයි අම්මා
රස පල වැල නෙළා දිදී රස්සා කළ අම්මා
.........................................................................................''

03) ''මගෙ රට මගෙ දැය නිසා
යුදු වැද සතුරන් නසා
.....................................................
.....................................................''

04) '' බන්දා විජය දද අකනිට පද හිමිමේ
සින්දා හළ එතෙක් රිපු සිරි ලක් අම්මේ
....................................................................................
....................................................................................''

05) '' ....................................................................................
....................................................................................
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ''

06) '' මල් පිපෙන පොකුණු ද
කඳු ගං කැලෑ කුඹුරු ද
.....................................................................
.....................................................................''

**<u>06) පහත දැක්වෙන ප්‍රකාශවල හිස්තැන් පුරවන්න.</u>**

01) සිංහල අක්ෂර මාලාවේ මුළු අකුරු ගණන ...........කි.

02) ස්වර අක්ෂර ගණන ...........කි. ස්වර අක්ෂර, .......................................... සහ .......................................... ලෙස ද හැඳින්වේ.

03) ව්‍යඤ්ජන අක්ෂර ගණන ...........කි. ව්‍යඤ්ජන අක්ෂර , .......................................... සහ .......................................... ලෙස ද හැඳින්වේ.

04) සිංහල අක්ෂර මාලාවේ ''ක'' සිට ''ම'' දක්වා ඇති අකුරු, ................................................ ලෙස හැඳින්වේ. මේවා ගණනින් ...........කි.

05) අක්ෂර උත්පත්ති ස්ථාන අනුව වර්ග ..........කට බෙදෙයි. එනම්,

i) ................................................, ii) ................................................,

iii) ................................................, iv) ................................................,

v) ................................................ යනුවෙනි.

06) **කණ්ඨජ** යනු ....................................... උපදින ශබ්දයි. වර්ගාක්ෂරවල **"ක" වර්ගයට** අයත්

......../........./........./........./......... අක්ෂර, ''**කණ්ඨජ අක්ෂර**'' වේ.

07) **තාලුජ** යනු ....................................... උපදින ශබ්දයි. වර්ගාක්ෂරවල **"ච" වර්ගයට** අයත්

......../........./........./........./......... අක්ෂර, ''**තාලුජ අක්ෂර**'' වේ.

08) **මූර්ධජ** යනු ....................................... උපදින ශබ්දයි. වර්ගාක්ෂරවල **"ට" වර්ගයට** අයත්

......../........./........./........./......... අක්ෂර, ''**මූර්ධජ අක්ෂර**'' වේ.

09) **දන්තජ** යනු ....................................... උපදින ශබ්දයි. වර්ගාක්ෂරවල **"ත" වර්ගයට** අයත්

......../........./........./........./......... අක්ෂර, ''**දන්තජ අක්ෂර**'' වේ.

10) **ඕෂ්ඨජ** යනු ....................................... උපදින ශබ්දයි. වර්ගාක්ෂරවල **"ප" වර්ගයට** අයත්

......../........./........./........./......... අක්ෂර, ''**ඕෂ්ඨජ අක්ෂර**'' වේ.

**07) පහත දැක්වෙන වචන නිදොස් කොට නැවත ලියන්න.**

01) වානිජ්‍යය ☞ ............................

02) පරිඝණකය ☞ ..........................

03) කණිෂ්ඨ ☞ ..............................

04) ත්‍යාග ප්‍රධානය ☞ ...................

05) ජනගහණය ☞ ........................

06) ඛණිජ ☞ .................................

07) කල්‍යාණි ☞ .............................

08) අදිෂ්ඨාන ☞ ............................

09) තීක්ශණ ☞ ..............................

10) කළාපය ☞ ..............................

11) කොළරාව ☞ ............................

12) රැළිය ☞ .................................

13) සියළු ☞ .................................

14) පිළිවෙල ☞ ..............................

15) විශ්මය ☞ ...............................

16) ආස්වාශ ☞ ...............................

17) කොට්ඨාශය ☞ ..........................

18) ආහාශය ☞ ...............................

19) විශ්කම්භය ☞ ...........................

20) න්‍යශ්ටික ☞ ...............................

21) දුස්කර ☞ ..................................

22) නිෂ්පල ☞ .................................

23) ශිෂ්ඨාචාරය ☞ ..........................

24) විශිෂ්ඨ ☞ .................................

25) දෘෂ්ඨිය ☞ ................................

26) පාපිෂ්ට ☞ ................................

27) ශ්‍රේශ්ඨ ☞ .................................

28) සමස්ථ ☞ .................................

29) ප්‍රස්ථාර ☞ ................................

30) මධ්‍යස්ත ☞ ................................

08) පහත දැක්වෙන පදවල නිවැරදි අරුත් ලියන්න.

01) නුවණ ☞ ....................................
02) නුවන ☞ ....................................
03) වණය ☞ ....................................
04) වනය ☞ ....................................
05) කණා ☞ ....................................
06) කන ☞ ....................................
07) ගැණ ☞ ....................................
08) ගැන ☞ ....................................
09) කුලුණු ☞ ....................................
10) කුලුනු ☞ ....................................
11) ඇළ ☞ ....................................
12) ඇල ☞ ....................................
13) පැළ ☞ ....................................
14) පැල ☞ ....................................
15) පිළී ☞ ....................................
16) පිලි ☞ ....................................
17) මුළු ☞ ....................................
18) මුලු ☞ ....................................
19) අළු ☞ ....................................
20) අලු ☞ ....................................
21) තුළ ☞ ....................................
22) තුල ☞ ....................................
23) කුළ ☞ ....................................
24) කුල ☞ ....................................
25) දළ ☞ ....................................
26) දල ☞ ....................................

09) පහත දැක්වෙන පද අකාරාදි පිළිවෙළට සකසන්න.

01) කසුන් / ඔසුර / වසීම් / ඉසුරු / නවිඳු

........................................................................................................................

02) මොරටුව / මීගමුව / මහරගම / මාවනැල්ල / මුල්ලේරියාව

........................................................................................................................

03) පූජාවලිය / ජාතකපොත / අමාවතුර / බුත්සරණ / ධර්මප්‍රදීපිකාව

........................................................................................................................

04) කහවත්ත / කහටගස්දිගිලිය / කහටපිටිය / කහඳමෝදර / කහල්ල

........................................................................................................................

05) සෞඛ්‍යය / ගණිතය / සිංහල / විද්‍යාව / ඉංග්‍රීසි

........................................................................................................................

**10) පහත දැක්වෙන විස්තරවලින් එකක් තෝරා ගෙන රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

01. ළමා සාහිත්‍යය, දරුවා අපූරු ලෝකයකට ගෙන යන සාහිත්‍යාංගයකි. ළමයින් උදෙසා කවි, කතා හා නාට්‍ය නිර්මාණය කරන්නට වෙහෙසුණු ලේඛකයෝ බොහෝ ය. ඔවුහු තම රචනා මගින් ළමා චරිතය සංවර්ධනය කරති. එබැවින් ළමා සාහිත්‍යය පෝෂණය කළ යුතු ය.

02. රූපවාහිනිය සහ පරිගණකය බොහෝ තොරතුරු ලබා ගත හැකි මාධ්‍ය බවට පත් වී ඇත. බොහෝ දරුවන් නාට්‍ය හා කාටූන් චිත්‍රපටවලටත් පරිගණක ක්‍රීඩාවලටත් නැඹුරු වීම නිසා ඔවුහු රූපවාහිනියෙන් හා පරිගණකයෙන් නිසි ඵල ප්‍රයෝජන නො ගනිති. අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි, ප්‍රධාන මෙවලම් ලෙස මෙම උපකරණ භාවිත කිරීම අත්‍යවශ්‍ය ය.

03. පරිසරය සුන්දර ව හා පිරිසිදු ව තබා ගන්නට අප වෙහෙසෙන විට පරිසරය ද අප නිරෝගී ව තබන්නට වෙහෙසෙයි. පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය නිසා අහිංසක සතුන් මරණයට පත්වන්නේ ඛේදනීය ආකාරයකට ය. අද ජීවත් වන සතුන් අනාගතයේ දී වඳ වී යාමට ඇති ඉඩකඩ බොහෝ ය. පරිසරය රකිමින් සතුන්ගේ ජීවිත ද රැක ගන්නට කැප වෙමු.

04. මවුපියන් දරුවන් රැක බලා ගන්නේ තම දෑස මෙනි. සිරිත් විරිත්, ගුණ දහම් හා නැණ නුවණින් පිරිපුන් දරුවකු සමාජයට දායාද කිරීම ඔවුන්ගේ එක ම පැතුම යි. එහෙත් ඇතැම් දරුවෝ ඉහළ රැකියාවලට ගොස් ගුණ දහම් හා සිරිත් විරිත් අමතක කරති. එයින් අසරණ වන්නෝ දෙමවුපියෝ ම ය. මේ තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරමු.

**සැකසුම :- ලහිරු දරණකුඹුර**

**පාසල :- බප/ මීග සාන්ත ජෝසප් විදුහල - මීගමුව ශාඛාව**

i කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

01. මිශ්‍ර සිංහල හෝඩියේ ස්වර අක්ෂර කීයද

i. 20 ii . 30 iii . 60 iv . 18

02. තල්ලෙන් උපදින අක්ෂර හඳුන්වනනේ කුමන නමකින් ද

i . මූර්ධජ ii . තාලුජ iii . දන්තජ iv . මේ කිසිවක් නොවේ

03. 'ගුරුවරු කොතරම් අවවාද අනුශාසනා කරනු ලැබුවද ඔහුගේ නරක ගති පැවතුම්වල අඩුවක් නොවීය.'
මෙහි අදහසට වඩාත් සමාන පිරුල වන්නේ,

i . ගල හොඳ නම් අඹරන කහ මක් වේද? ii . උණ පුරුකේ දැම්මත් බලු වලිගේ ඇදේ නොඇරේ

iii . වක්කඩේ හකුරු හැංගුවා වාගේ iv . කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලුවා වාගේ

04. 'ඔහු බුද්ධිමත්කම ප්‍රදර්ශනය කරමින් නිෂ්ෂබ්දතාව ආරක්ෂා කළේ ය.'
මෙහි අදහසට වඩාත් සමාන ආප්තෝපදේශය වන්නේ,

i . හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ ii . උගත මනා ශිල්පයමයි මතු රැකෙනා

iii . පිරුණු කළේ දිය නො සැලේ iv . අවි ගත්තෝ අවියෙන්ම නසිති

- **පහත ඉරිඇඳි කොටසේ අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න**

05. <u>ගඟට ඉනි කැපුවා</u> යන්නේන් අදහස් වන්නේ කුමක් ද?

i . නිෂ්ඵල ක්‍රියාවන් සිදුකිරීම ii . යහපත් ක්‍රියාවන් සිදුකිරීම

iii . අත්‍යාවශ්‍ය රාජකාරීයන් ඉටුකිරීම iv . අයහපත් ක්‍රියාවන් සිදුකිරීම

06. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ <u>ගොළුබෙලි ගමන</u> හේතුවෙන් එහි ඵලදායිතාව අඩු විය. මෙයින් අදහස් වන්නේ ව්‍යාපෘතියේ,

i . වේගවත් බවයි ii . ඉතා හොඳ බවයි

iii . ඉතා අයහපත් බවයි iv . මන්දගාමී බවයි

07. සතුට යන්නට සමාන අරුතක් ගෙන නොදෙන්නේ

i . ප්‍රමෝදය ii .සිසි

iii . තොස iv .තුට

08. ගුණ යන පදයේ විරුද්ධාර්ථ පදය ලෙස ගැනිය හැක්කේ මින් කුමක් ද?

i . දුර්ගුණ ii . අවගුණ

iii . නිර්ගුණ iv . නොවගුණ

09. ගැලපෙන පදය තෝරා පළමු පදයට ඉදිරියෙන් නිරුරදි අක්ෂරය ලියන්න

| | | |
|---|---|---|
| i . අබල | ...... | අ. බමයි |
| ii . හරකා | ...... | ආ. ලොට්ට |
| iii . ලට්ට | ...... | ඉ. බාන |
| iv . ළමයි | ...... | ඊ. දුබල |

10. ච, ඡ, ජ, ඣ සහ ඤ කුමන අක්ෂර වර්ගයකට අයත් ද

i . ඌෂ්මාක්ෂර ii . වර්ගජ

iii . මූර්ධජ iv .තාලුජ

- **හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න**

11. .................................... නොකියා මෙතනින් පිටවී යනු.

12. අම්මා එනතුරු මා .................................... සිටියේ ය.

13. ඔහු .................................... යැයි තේරුම් යන විට ඇය බොහෝ ප්‍රමාද වී තිබුණි.
(දිවදෙකේ මිනිසෙකු, වැල්වටාරම්, ඇඟිලි ගනිමින්)

14. පහත සඳහන් සරල ඡේදයේ දක්වා ඇති විරාම ලක්ෂණ පිළිවෙළින්

උත්සවය පැවැත්වීමට නියමිත වන්නේ 2020.02.02 වන දින ය. ඒ සඳහා රතු,නිල් සහ කහ යන වර්ණ තුනෙන් උත්සව ශාලාව අලංකාර කිරීමට තීරණය කර ඇත. විදුහල්පති තුමා/උප විදුහල්පති තුමා විසින් ආරාධිත අමුත්තන් පිළිගැනීමට නියමිතයි.

i . දෙතිත, උඩු කොමාව සහ කෙටි ඉර ii .තිත, කොමාව සහ ඇල ඉර
iii .තිත්පෙළ, තනි උඩු කොමාව සහ ඇල ඉර iv .තිත, තනි උඩු කොමාව සහ ඇල ඉර

15. විරුද්ධාර්ථ පද සෑදිය හැකි උපසර්ගයක් වන්නේ
i . බල ii . අව iii . නොව iv . කව

16. වඩා සදෙව් ලොව සැප විඳ නිවන් දකින් සොඳිනේ... මෙහි සදෙව් ලොව යනු කුමක් ද
i . අලංකාර නිවාස ii . උද්‍යාන iii . දිව්‍ය ලෝකය iv . අපාය

17. සියලුම පදවල නිවරදි අක්ෂර වින්‍යාසය සහිත වරණය තෝරන්න
i . ප්‍රමෝදය, වෘක්ෂය, ප්‍රසිද්ධ, අරණ ii . සමුද්‍රය, දුෂ්කර, දේශීය, විපක්ෂ
iii . දක්ෂ, පැරනි, රංචුව, දේශනය iv . ශ්‍රේෂ්ඨ, අරමුණ, ස්මරණ, වර්ධනය

18. තාලුජ අක්ෂරයක් සහිත පදය තෝරන්න
i . සවන ii . ජලය iii . පවන iv . රචන

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න**

19. මනා ............................................ සමන්විත මෙම විශේෂ චරිතය පිළිබඳ ග්‍රන්ථ රාශියක් ලියා ඇත.
i . ආබාධයකින් ii . අභියෝගයකින් iii . පෞරුෂයකින් iv . වියෝගයකින්

20. ග්‍රාහකයාට කරුණු ............................................ කිරීමට ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රයෝග භාවිතය සුදුසුය.
i . අනිඨ ii . සනාථ iii . විනාශ iv . සමාස

(ලකුණු $2 \times 20 = 40$)

## ii කොටස

**පළමු ප්‍රශ්නය සහ දෙවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න**

01. දේශීය නර්තනයේ රන් සලකුණ පාඩම ඇසුරෙන් ඔබ විසින් සිදුකරනු ලැබ කණ්ඩායම් ක්‍රියාකාරකම පිළිබඳ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

i . ඔබ කණ්ඩායම විසින් තොරතුරු ගොනු කරනු ලැබුවේ කුමන මාතෘකාවක් යටතේද
ii . මෙම කණ්ඩායම් ක්‍රියාකාරකම සිදුකිරීමේදී ගුරුවරයා ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න
iii . අචාර්ය පණීභාරතයන් නියෝජනය කරනු ලැබුවේ කලාවේ කුමන අංශයක් ද
iv . අනෙකුත් කණ්ඩායම් තොරතුරු රැස්කළ වෙනත් මාතෘකා දෙකක් ලියන්න

(ලකුණු 16)

02. පහත සඳහන් එක් මාතෘකාවක් පිළිබඳ වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න

i . මා ගිය විනෝද චාරිකාවක්
ii . වන සම්පත සුරකිමු
iii . මගේ රට

(ලකුණු 14)

03. සිය පිරිවර රට තොට හැම වස්තුව නැති නි     මිමා
එද ලොබ හැර ඔබ සමගින් තපසට ආවෙ     මිමා
..........................................................................................
..........................................................................................

i . මෙම කවියේ අවසන් පද දෙක සම්පූර්ණ කරන්න
ii . මෙම කවිය අයත් පාඩමේ නම කුමක්ද
iii . සඳ යන්නට සමාන පදයක් ලියන්න
iv . මෙහි තුරු පිරිවර යන්නෙන් අදහස් වන්නේ කුමක්ද
v . මෙම කවි පංතිය අයත් වන කෘතිය කුමක්ද

(ලකුණු 10)

04. (අ) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කාහට කියන ලද්දක් දැයි සහ එය ඇතුළත් වන පාඩමේ නම සඳහන් කරන්න

i . මැණියනි ඔබගේ ශෝකය දුරු කරවා ගත මැනව

පාඩමේ නම ..................................................................
කවුරුන් විසින් ද ..................................................................
කාහට ද ..................................................................

ii . ඒ ශ්‍රේෂ්ඨ මිනිසා කවුරුද? ඒ කිසිවෙක් නොවෙයි ......

පාඩමේ නම ..................................................................
කවුරුන් විසින් ද ..................................................................
කාහට ද ..................................................................

(ආ) පහත හිස්තැන් සඳහා සුදුසු යුගල පද යොදන්න

කෑම .......................... හිඟ වුවත් .......................... බාන නොමැති වුවත් අගුණකොල ගමේ දරුවෝ ඉගෙනීමට සමත්කම් පෙන්වති. .......................... දොරක් යහමින් සකසා ගැනීමට ඔවුන්ගේ දෙමව්පියන්ට නොහැකි වුවත් තම දරුවන්ගේ අනාගතය වෙනුවෙන් මුදල් .......................... යෙදවීමට ඔවුන් පසුඉට නොවෙති.

(ලකුණු 10)

05. වටේ මහ මුහුදයි

සීතල සුළං විහිදයි

................................

................................

i . මෙය කා විසින් රචිත කවි පංතියක් ද
ii . මෙම කවි පංතියෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳවද
iii .මෙහි සඳහන් වන විශේෂණ පදයක් සඳහන් කරන්න
iv . මහ යන පදයට සමාන අර්ථයක් සහිත පදයක් ලියන්න
v . සීතල යන්නට විරුද්ධාර්ථ පදයක් ලියන්න

(ලකුණු 10)

06. පහත ඡේදය කියවා අසා ඇත් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

සිරිපාල දුල්ලෑව ගමෙහි වාසය කරන දුප්පත් ගොවියෙකි. එසේම ඔහු අලස ගොවියෙකි. ඔහු විවාහ වී සිටියේ ගමෙහි වැදගත් යැයි සැළකෙත ගුරුවරයෙක් වූ සිරිසෝමගේ එකම සහෝදරියත් සමගින් ය. ඇය නමිනි සිරිමලී සිරිපාලගේ අලසබව නිසාම ගොවිතැනින් සරු අස්වැන්නක් ලබන්නට කිසිදාක නොහැකි විය. දිනක් හෙතෙම හේනට යනවිට වන සතුන් වගාව විනාශ කරඇති අයුරු දැකගත හැකි විය. හේන් රැකීමට උනන්දුවක් නොතිබුණු ඔහුට අලසබව නිසාම මහත් පාඩුවක් වූ බවට ගම්වාසීන් නිතර තැන් තැන් වල පවසන්නට විය. මෙයින් පාඩමක් ඉගෙනගත් සිරිපාල ඉදිරි කන්නයේදී හොඳින් වගාව සිදුකරන බවට තමන්ටම පොරොන්දු කරගත්තේ ය. එම අස්වැන්න විකුණා හොඳ කරත්තයක් මිලදී ගැනීම සිරිපාලගේ අභිලාශය විය.

i . අලස ගොවියාගේ නම කුමක් ද
ii . ඔහු වාසය කරනු ලැබූ ගම කුමන් ද
iii . ඇගේ බිරිඳගේ සහෝදරයා කවු ද
iv . සිරිපාලගේ ජීවනෝපාය මාර්ගය කුමක් ද
v . සිරිපාලගේ බලාපොරොත්තුව වූයේ කුමක් ද

07. (අ) පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න
i . ඇය නිතිපතා පාසල් ගියෙමු
ii . අපි අඹ ගෙඩි කිහිපයක් අහුලා ගතිමි
iii . ඔවුන් ඉහල අහසේ පියාසර කරේ ය

(ආ) පහත දැක්වෙන වචනවලට සමානාර්ථ පද ලියන්න
i . හිරු
ii . වනය

(ඇ) පහත දැක්වෙන වචනවලට විරුද්ධාර්ථ පද ලියන්න
i . යහපත්
ii . විනීත

# පිළිතුරු



Answer

පළමු වාර පරීක්ෂණ - 2019
සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය I

(01) 42 යි - III
(02) පෝෂණය - IV
(03) පාපිෂ්ඨ - III
(04) ප්‍රශ්වාස - I
(05) 1 - මිශ්‍ර ක්‍රියා 2 - නිපාත
(06) ක්‍රියා විශේෂණයකි
(07) රූඪී පදයකි
(08) 1 - ගායිකාවක් 2 - ඔවුහු
(09) බලමින් III
(10) මිනිස්සු ගවයන් කුඹුරට දක්වූහ / දක්කුවෝය
(11) අර්ථය ප්‍රකාශ වන නිවැරදි වාක්‍ය සඳහා ලකුණු දෙන්න.
(12) 1- මාර්ටින් වික්‍රමසිංහ ශූරීහු නවකතා පොත් රැසක් ලියූහ / ලිව්වෝය
2-ගුරුවරු අපට යහමඟ පෙන්වා දෙති
(13) 1- ප්‍රසිද්ධ , පසිඳු , ප්‍රකට , පරසිඳු
2-පිපි , පුබුදු , පුල් , මිණිමුතු
(14) 1 - මැසින්න 2-සෙර / හෙර
(15) 1 - නිර්ලෝභ 2 දුදන
(16) ජන ශ්‍රැතියට
(17) රූඪී
(18) සාවධානව

(19) සිංහල අක්ෂර මාලාවේ "ක" අක්ෂරයේ සිට "ම" අකුර දක්වා ඇති අක්ෂර වර්ගාක්ෂර ලෙස හැඳින්වේ.
(20) 2016, 2017 විශ්ව විද්‍යාල අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් බාරගැනීම 20 වැනි දායින් අවසන් වේ.

(ලකුණු 2x20=40)

පිළිතුරු පත්‍රය II

01
(01) ජනශ්‍රැතිය නමින්
(02) ඩී.පී. වික්‍රමසිංහ මහතා
(03) අල්ගම සිරියා , කිරිගණිතයා යන ගුරුන්ගෙන්
(04) අපි අද ඒ උතුම් කාර්යය පවත්වමු
(05) මිල මුදල් , නඩුහබ , සමිති සමාගම් , වැනි යුගල පද දෙකක්
(06) සාධාරණ සාපේක්ෂවාදය හා විශ්ව න්‍යාය යන විෂය ක්ෂේත්‍රයයි
(07) මූර්ධජ ට, ඨ, ඩ, ඪ, ණ
(08) ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා
(09) මුහුදු දියත් මදෙයි සිතා රස කිරි දුන් අම්මා
සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා
(10) මේ මගේ මව් බිම
වඳිමි සැලකිලි කරමි නිතරම

02
(01) අ) ශ්‍රී පාදය වැන්දවූ හැටි
ආ) සිටු කුමරිය / සිටු දුව / දරුවන් දෙදෙනාගේ මව
ඉ) තමාටම

(02) අ) කථකයා / දේශකයා /කලාශූරීන් ජගත් විමලසුරේන්ද්‍ර මහතා
ආ) දේශීය නර්තනයේ රන් සලකුණ
ඉ) ආචාර්ය එස්. පණීභාරත මැතිතුමා

(03) අ) ලප සේ සඳ විලසේ
ආ) අම්මා රසවත් වූ එල වැල කඩා දෙමින් අපව ආරක්ෂා කළ බව ප්‍රකාශ වන අදහසට ලකුණු පිරිනමන්න.
ඉ) සතර අපාවල නොඉපිද නිවන් දකින් අම්මා

(04) අ) ශ්‍රී පාදය වැන්දවූ හැටි
ආ) බාල පුත්‍රයා විසින්
ඉ) මවට / සිටු දුවට

(05) අ) ස්ටීවන් හෝකින්
ආ) ස්ටීවන් හෝකින්
ඉ) ආචාර්ය මධුරංග ප්‍රනාන්දු මහතා

(ලකුණු 3 x 5 = 15)

**(03)** 01 - සාරවත් භාවය
02- සංවිධානය , නිර්මාණාත්මක බව හා ස්වීයත්වය (ලකුණු 06)
03- ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම (ලකුණු 04)

(04) 01- ආකෘතිය - (ලකුණු 03යි)
02- අන්තර්ගතය - (ලකුණු 04)
03- ශිල්පීය දක්ෂතා - (ලකුණු 03)

(05) I) පිටිකර
(ii) අඹරන කහ
(iii) කිරෙන් සේදුවත්
(iv) බලු වලිගේ
(v) බේත්

(ලකුණු 1 x 5 = 5)

(06) I) කුලුණු
(ii) නළ
(iii) කණ
(iv) දණ
(v) මළ

(ලකුණු 1 x 5 = 5)

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ